

# ගුණ දකිමු

පිටු අංක 39



## මෙත් සිත වඩමු

පිටු අංක 58

## නිර්මාණ ඉසව්ව

පිටු අංක 48

## සෙනෙහෙබර ආමන්ත්‍රණය

පිටු අංක 23

## දේවදත්ත තෙරුන්ගේ කථා වස්තුව

පිටු අංක 12

## සේරිවාණිජ ජාතකය


පිටු අංක 29

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීර්යයෙන්
ජීවිතය ජයගන්නට වෙර දරන
පින්වත් දූ පුතුන් උදෙසා

ශ්‍රී බුද්ධ වර්ෂ 2562 | ව්‍යවහාර වර්ෂ 2018
( සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් )

www.shraddha.lk




අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී තිළිණි කෞෂල්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහාමේඝනාද
භාවනා අසපුව

ශ්‍රද්ධා
රූපවාහිනිය

ලක්විරු
ගුවන්විදුලිය
LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද මිනිස් ජීවිතය
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

නමෝ බුද්ධාය!

ශ්‍රී බුද්ධ වර්ෂ 2562ක් වූ ජූනි මස 22 වන දින දී ය.

පින්වත් දුවේ පුතේ,

**'සත්පුරුෂකම'** ගැන ඔබ නොයෙක් අවස්ථාවල අසා තිබෙනවා. සත්පුරුෂකම කියන්නේ කළගුණ දන්නා බවට. පරිපූර්ණ සත්පුරුෂ භූමිය කියන්නේ කළගුණ සිහි කරනා බවට. ලෝකයේ පහළ වූ පරම සත්පුරුෂයාණන් වහන්සේ තමයි අපි ආදරයෙන් සරණ ගිය සම්බුදුරජාණන් වහන්සේ. ඒ සත්පුරුෂ හදමඬලෙහි පැනනැගුණු ධර්මය ඒකාන්තයෙන් ම සත්පුරුෂ ධර්මය යි. සත්පුරුෂ ගුණයට පමණක් ම නෑකම් කියන මේ උතුම් ධර්මය වැඩෙන්නේ, දියුණු වන්නේ, අභිවෘද්ධියට පත් වන්නේ සත්පුරුෂයන් තුළ ම පමණයි. ඒ නිසා දුවේ පුතේ, අප සත්පුරුෂයන් වන්නට බලවත් ව කැමති විය යුතුයි...

දුවට පුතාට සත්පුරුෂයන් වන්නට වැඩි ම ඉඩක් තිබෙන තැනින් ම මේ සොඳුරු ගමන තුළ පිහිටන්නට උපකාරක වන කරුණක් සිහිපත් කර දෙන්නට අප කල්පනා කළා. දුවේ පුතේ, ඔබේ නිවස ඔබට සත්පුරුෂ දරුවන් ලෙසින් වැඩී යන්නට හොඳ ම අවස්ථාව සලසාලන තැනයි. ඔබට මේ උතුම් සම්බුද්ධ ශාසනය තුළ සොඳුරු පින්දහම් රැස් කර ගන්නට අවස්ථාව ලැබුණේ මිනිස් ජීවිතය තුළ ලද සුගති උපත නිසයි. ඒ උපත ඔබට උරුමය කරලූ අම්මා, තාත්තා කෙරෙහි ඔබ සිතෙහි අප්‍රමාණ ආදර ගෞරවයක් තිබිය යුතු ම යි. දෙමාපියන් ගැන සම්බුදුරජාණන් වහන්සේ වදාරන්නේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතරක් වූ උත්තම විහරණයන්ගෙන් යුතු බ්‍රහ්මරාජයන් වැනි බව යි, දරුවන්ගේ පළමු ආචාර්යවරුන්

බව යි, දුර සිට වුව පැමිණ පුද සත්කාර දක්වන්නට - වන්දනාමාන කරන්නට සුදුසු වූ ආහුණෙය්‍ය ගුණැති උත්තමයන් බව යි. දුවේ පුතේ, අප සත්පුරුෂයන් වන්නේ අපට මේ දුර්ලභ මිනිස් ජීවිතය උරුම කරලූ ඒ උතුම් ගුණැතියන් කෙරෙහි අප සිතින්, කයින්, වචනයෙන් යහපත් ආකාරයෙන් ම කටයුතු කළොත් පමණයි.

දුව පුතා පමණක් නොවෙයි, අප කවුරුවත් ජීවිතයේ මුල් කාලයේ තනිව කිසිවක් කර ගන්නට හැකි වූවන් නොවෙයි. අප මළමුත්‍රා පවා ඇඟේ ම තවරාගෙන අපහසුවෙන් හඬමින් සිටිය දී අපට පහසුව සැලසුවේ දෙමාපියන්. අපට පිරිසිදු වන හැටි, ඇඳුමක් පැලඳුමක් ලාගන්නා හැටි, කන බොන හැටි, වැසිකිළි කැසිකිළි කරන හැටි පවා ඉගැන්වූයේ දෙමාපියන්. මනුෂ්‍ය වර්ගයා තරම් ස්වකීය දරුවන් සමීපයේ තබා ගනිමින් සොයා බලා පෝෂණය කරන සත්ව කොට්ඨාසයක් මිහිතලයේ නැහැ. ඒ සියල්ලට ම අප බොහෝ ණයගැතියි.

දෙමාපියන්ගේ පූජනීය භාවය නිසාවෙන් ඒ දෙදෙනා ම දුටු විට හුනස්නෙන් නැගිට ගරු සරු දක්වන්නට සුදුසුයි. වැඳුම් පිදුම් කරන්නට ද සුදුසුයි. අපට යටහත් ඇවතුම් පැවතුමෙන් යුතු වන්නට ද සුදුසුයි. අම්මා තාත්තා දෙදෙනා ම සෑම දරුවෙකුගේ ම ජීවිත තුළ සෑම කල්හි ම ගරු බුහුමන් දක්වා පිදුම් දෙන්නට සුදුස්සන් ම යි.

යම් කෙනෙකු අතින් සිදු වන පාපකර්මයක් නිසා මේ ජීවිතයෙන් පසු නිසැකව ම ඒ කෙනා නිරයේ උපදිනවා නම් එවැනි කර්මයනට කියන්නේ ආනන්තරීය පාපකර්ම කියා බව ඔබ අසා තිබෙනවා. එවැනි පාපකර්මයන් පහක් සම්බුදුරජාණන් වහන්සේ පෙන්වා

වදාළා. දුවේ පුතේ, සම්බුදුරජාණන් වහන්සේ, රහතන් වහන්සේලා සහ සංඝ රත්නය විෂයෙහි හැරුණු කොට එසේ අතොරක් නැතිව නිරයේ ම උපදින කර්මයන් සකස් වන්නේ මව සහ පියා කෙරෙහියි. යම් කෙනෙකු අතින් මව මැරුණොත්, පියා මැරුණොත් ඒ කෙනා ඒකාන්තයෙන් ම කල්පයක් නිරයේ පැසෙන්නට විපාක ඇතිව ඊ ළඟ ජීවිතයේ නිරයේ උපදිනවා. මව, පියා යනු කොතරම් නම් ආනුභාව සම්පන්න උතුමන් ද කියා මෙයිනුත් අප තේරුම් ගත යුතුයි.

දුවේ පුතේ, නිවසේ වසන මේ බ්‍රහ්මයන් කෙරෙහි කයින් තබා වචනයකින් හෝ වැරදි ලෙස කටයුතු කරන්නට නම් එපා. බැල්මකින්වත් නුසුදුසු ආකාරයෙන් හැසිරෙන්නට නම් එපා. එය ඔබට බොහෝ කාලයක් අහිත පිණිස, අයහපත පිණිස පවතිනවා. මේ තාක් ඔබ අතින් එවැනි වැරදි වී තිබෙනවා නම් මාපියන්ට වන්දනා කොට මින් මතු එවැනි පාපී අකුසල් සිදු නොවන්නට සංවර වෙනවා කියා සමාව ගන්න. අද ම ඒ සියලු වැරදිවලින් නැගී සිට නිවසේ බ්‍රහ්මයන් මැනැවින් පුදනා සත්පුරුෂ ගුණැති දරුවන් බවට ඔබත් පත්වෙන්න.

තෙරුවන් සරණයි!

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
(ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය)

# පටුන


01. දේවදත්ත තෙරුන්ගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 23

03. සේරිවාණිජ ජාතකය 29

04. ගුණ දකිමු 39

05. නිර්මාණ ඉසව්ව 48

06. මෙත් සිත වඩමු 58

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

(යමක වර්ගය)

පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන් වහන්සේ



ඉඳුරන් දමනය නොකරන - ඇත්ත කථාබහ නොකරන
ඔහුට සුදුසු නැහැ කිසිවිට - දරා සිටින ඒ කහවත

# දේවදත්තගේ කථා වස්තුව

## "සිතේ කෙලෙස් කහට ඇති කෙනාට කසාවතින් ඇති ඵලය කිම? කසාවත සුදුසු වන්නේ කෙලෙස් කහට නැති කෙනාට නොවේද?"

පින්වතුනේ, පින්වත් දරුවනේ, බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් වසරකට පසු තම පියරජතුමා ප්‍රධාන රටවැසියන් හට උතුම් ධර්මය ලබාදීම පිණිස මහා කරුණාවෙන් කිඹුල්වත් නුවරට වැඩිය වග ඔයාලා දැනටමත් දන්නවා. බුදුරජාණන් වහන්සේගේ වැඩම කිරීමෙන් පසු මුළු කිඹුල්වත් පුරයම වෙනස් වුණා. ශාක්‍ය වංශිකයන් තිසරණයේ පිහිටි පිරිසක් බවට පත්වුණා. බුදුරජාණන් වහන්සේට ශාක්‍යසිංහ, ශාක්‍යමුනි, ආදිච්චබන්ධු (හිරුගොත් වංශයේ ඥාතියා) ආදී උදාර නම්වලින් ගෞරව කළා. උන්වහන්සේගේ ඥාතීන් වන නන්ද කුමාරයා, ආනන්ද කුමාරයා, භගු කුමාරයා, කිම්බිල කුමාරයා ආදී පිරිසත් උන්වහන්සේ ළඟ පැවිදි වුණා. ඒ වගේම දේවදත්ත කුමාරයාත් පැවිදි වුණා.

දෙවදත්ත කියන්නේ රජ පවුලට අයත් කෙනෙක්. යසෝදරා දේවියගේ වැඩිමහල් සහෝදරයා වුණේ දේවදත්ත. ඉතින් දේවදත්ත ඉතාම ලස්සන රූපයක් ඇති කෙනෙක්. මහානුභාව සම්පන්න පෙනුමක් ඇති කෙනෙක්. දක්ෂ කෙනෙක්. මොහු පැවිදි වුණු විට පැවිද්දන් අතරේ දේවදත්තගේ රුව ලස්සනට කැපී පෙනුණා. දේවදත්ත ඉතා හොඳින් සිල් පද ආරක්ෂා කළා. චිත්ත සමාධිය ඇති කරගත්තා. කොටින්ම නොයෙක් වෙස්ගන්න පුළුවන් ආකාරයේ ඉර්ධි බලත් ඇති කරගත්තා. දේවදත්තගේ දක්ෂකම ගැන හැමෝම සතුටු වුණා. සාරිපුත්ත මහරහතන් වහන්සේත් දේවදත්ත ගැන බොහෝම ප්‍රශංසාවෙන් කතා කළා. ටිකෙන් ටික දේවදත්ත ප්‍රසිද්ධ භික්ෂුවක් වුණා. සියලු දෙනාම බොහෝ සෙයින් ගෞරව කරන්න පටන් ගත්තා. භික්ෂුන් වහන්සේලාගේ සිත දිනා ගන්නට දේවදත්ත සමත් වුණා. මේ විදිහට සමාජයේ නායකත්වයට පැමිණෙද්දී දේවදත්ත කල්පනා කළේ බුද්ධ ශාසනයේ සැබෑ නායකත්වය තිබිය යුත්තේ තමන්ට බවයි.

තමන් කැමති පරිද්දෙන් සඟ පිරිස පාලනය කිරීමේ පව්ටු ආශාවක් දේවත්තට ඇති වුණා. දේවදත්ත මෙහෙම කල්පනා කළා.

'දැන් ඉතින් භාග්‍යවතුන් වහන්සේ විවේක ගන්න එකයි හොඳ. මමත් දැන් ප්‍රසිද්ධ කෙනෙක් නෙව. අනික මම ළඟම ඥාතියා. මම තමයි ඊළඟට මේ සසුනේ නායකත්වයට එකම සුදුස්සා වෙන්නේ. දැන් සඟ පිරිස හසුරුවන එක මට හොඳට කරන්න පුළුවන්කම තියෙනවා. මට මේ පිරිස කෙරෙහි ලොකු කැක්කුමක් තියෙනවා.'

දේවදත්ත හැම තිස්සේම පිරිසේ යහපත වෙනුවෙන් කැප වූ කෙනා හැටියට උජාරුවෙන් පෙනී සිටියා. ඒ ගැනම සතුටු වුණා.

දිනක් බුදුරජාණන් වහන්සේ ළඟට ගිය දේවදත්ත උන්වහන්සේට වන්දනා කොට මෙහෙම ඉල්ලීමක් කළා.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, දැන් භික්ෂු පිරිස අතිවිශාලයි. විවිධාකාර ප්‍රදේශවලින් පිරිස පැමිණ පැවිදි වෙනවා. මේ සඟ පිරිස වෙනුවෙන් ඔබවහන්සේ සෑහෙන සේවාවක් කළා. දැන් ඔබවහන්සේට කිසිම විවේකයක් නැහැ. ඒ නිසා ස්වාමීනී, මාව විශ්වාස කරන්න. මට මේ පිරිස හොඳට හසුරුවන්න පුළුවන්. ඒ කවුරුවත් මා කියන දෙයට හොඳින් සවන් දෙනවා. එනිසා මේ සඟ පිරිස මට භාර දෙන්න."

තුන්වතාවක්ම මේ ඉල්ලීම කළා. බුදුරජාණන් වහන්සේ දේවදත්ත දෙස අනුකම්පාවෙන් බලා සිටියා. කෙලෙස් තවන වීරියෙන් යුතුව කෙලෙසුන්ගෙන් මිදීමට උත්සාහ නොකොට තාවකාලිකව ලැබෙන ලාභසත්කාර කීර්ති ප්‍රශංසාවලට දේවදත්ත හසුවුණා. පව්ටු ආශාවන් ගෙන් සිත වෙළා ගත්තා. චතුරාර්ය සත්‍යය අවබෝධය සම්පූර්ණයෙන්ම අමතක වුණා. තථාගතයන් වහන්සේ කවුද යන වග අමතක වුණා. සමාජ නායකත්වයටම සිත යොමු වුණා.

බුදුරජාණන් වහන්සේ දේවදත්තට අවවාද කළා.

"දේවදත්ත, සැරියුත් මුගලන් හට වත් මම සඟ පිරිසේ නායකත්වය භාරදීලා නෑ. මා විසින් ඉදිරිපත් කළ ධර්ම විනයේ

නායකත්වය ශාස්තෘවරයෙක් යටතේ පවතින දෙයක්, එවැනි දෙයකට ඔබ සුදුසු නැහැ. මෙවැනි ඉල්ලීම් මින් මතු නොකළ යුතුයි."

බුදුරජාණන් වහන්සේගේ අවවාදය පිළිගැනීමට තරම් ආඩම්බරකාරී දේවදත්ත නිහතමානී වුණේ නෑ. එදා බුදුරජාණන් වහන්සේ වෙතින් දේවදත්ත බැහැරට ගියේ උන්වහන්සේව විනාශ කොට හෝ බුදු සසුනේ නායකත්වය ලබාගැනීමේ උමතු ආශාවෙන්. දේවදත්ත කෙමෙන් කෙමෙන් තමාගේ අදහස ඉෂ්ට කරගැනීම පිණිසම මහන්සි වුණා. පවිටු දේවදත්ත හඳුනා නොගත් ගිහිපැවිදි බොහෝ දෙනෙක් ඔහුගේ මායාකාරී බස්වලට රැවටුණා.

ඒ කාලයේ රජගහ නුවර සැදැහැවත් පිරිස බොහෝ දන්පැන් පිළියෙළ කරල භික්ෂූන් වහන්සේලාට ආදරයෙන් ඇප උපස්ථාන කරනවා. චාරිකාවේ වඩින භික්ෂූන් වහන්සේලා සිය දහස් ගණනින් පිඬු සිඟා වඩින අයුරු මහත් ශ්‍රද්ධාවෙන් දැක බලා සතුටු වෙනවා. එක් කාලයක සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා ප්‍රධාන භික්ෂූන් වහන්සේලා චාරිකාවේ වඩින අතරේ රජගහ නුවරට වැඩම කළා. බොහෝ සැදැහැවතුන් එක්ව ඒ සියලු ස්වාමීන් වහන්සේලාට මහා දානයක් පිළියෙළ කළා. එහිදී එක් ධනවත් පින්වතෙක් ඉතාමත් වටිනා වස්ත්‍රයක් සිවුරක් පිණිස සකසා එම දානයේදී පූජා කිරීමට සූදානම් කළා.

රජගහ නුවර මහත් කීර්තියක් දරා සිටි දේවදත්ත හට ඒ සිවුර සුදුසු යැයි බොහෝ දෙනෙක් කියා සිටියා.

"මේ අහන්න.... ඔය සැරියුත් මුගලන් ආදී ස්වාමීන් වහන්සේලා වැඩිකල් මෙහෙ රැඳෙන්නේ නෑ. චාරිකාවේ වඩිනවා. අපට නිතර මුණ ගැහෙන්නෙත් නෑ. නමුත් මේ දේවදත්ත ස්වාමීන් වහන්සේ එහෙම නොවේ. අපේ පවුලේ කෙනෙක් වගේ. නිතර අපේ සැප දුක් සොයා බලනවා. දරුවන්ගේ ලෙඩට දුකට සෙත් පතනවා. මංගල උත්සව වලදී ආශීර්වාද කරනවා. අපි කාගෙත් කරදරයේදී පිහිට වෙනවා. දුකේදී අප සමඟ දුක් වෙනවා. සතුටේදී අප සමඟ සතුටු වෙනවා. අපේම කෙනෙක් වගේ. ඒ නිසා වටිනා වස්ත්‍රය වඩා සුදුසු වන්නේ

දේවදත්තයන් වහන්සේටමයි.

එතකොට තව පිරිසක් මෙහෙම කිව්වා.

"එහෙම කියන්න එපා. අපි පුද්ගලික වාසි බලලා පින් කරන්න හොඳ නැහැ. අපි පින් කළ යුත්තේ කොහොමද කියලා බුදුරජාණන් වහන්සේ අපට දේශනා කරල තියෙනවා. රාග, ද්වේෂ, මෝහ ප්‍රහාණය කොට වදාළ රහතුන් වහන්සේලා වැඩඉන්නවා. සැරියුත් මුගලන් ආදී රහතන් වහන්සේලා දෙස ඔබ නොබලන්නේ මක් නිසාද? පුන් සඳ පායා බැස යන පරිද්දෙන්, සැමදාම අහසේ දිලෙන අලුත් සඳක් පරිද්දෙන්, නොඇලුණු සිතින් උන්වහන්සේලා කල් ගෙවනවා. නෙළුම් කොළයෙහි නොරැඳෙන දිය බිඳුව රූරා පහළට හැලෙන පරිද්දෙන් උන්වහසේලා කිසිවකට නොඇලී වාසය කරනවා. තමාගේ ඇස, කන, නාසය, දිව, කය, මනස යන හයට පවා නොඇලුණු ඒ රහතන් වහන්සේලා ගිහියන්ගේ සැපදුක්වලට ඇලී සිටීවිද? ඒ නිසා අප පැහැදිය යුත්තේ ඒ උතුම් රහතන් වහන්සේලාට නොවේද? ඔය වස්ත්‍රය සුදුසු වන්නේ සාරිපුත්ත මොග්ගල්ලාන උත්තමයන් වහන්සේලාටමයි."

එතකොට දේවදත්ත පාක්ෂික පිරිස හඬ නඟා කෑ ගැසුවා.

"ඔයාල කියයි... ප්‍රශ්නයක් වුණාහම තමයි දේවදත්තයන් වහන්සේගේ වටිනාකම තේරෙන්නේ. දේවදත්තයන් වහන්සේ මොනතරම් සිල්වත්ද! කවුරු කොහොම කිව්වත්, නිවන් මගේ ඉදිරියෙන්ම සිටින්නේ දේවදත්තයන් වහන්සේ කියලයි අපි කියන්නේ. දේවදත්තයන් වහන්සේ තුන් සිවුරෙන්මයි ජීවත් වෙන්නේ. පාංශුකූල සිවුරෙන්මයි ජීවත් වෙන්නේ. පිණ්ඩපාතයෙන් මයි ජීවත් වෙන්නේ. ආරණ්‍යයේමයි ජීවත් වෙන්නේ. ඒ විතරක්ද? දේවදත්තයන් වහන්සේ කිසි දවසක පිළිහුඬු වර්ගයක් වළඳන්නේ නැහැ. නිර්මාංශ, එළවළු ආහාරයෙන් මයි උන්වහන්සේ සතුටු වෙන්නේ. ඒ එළවළු දානය වැළඳීම ගැනමයි ගුණ කියන්නේ. ධර්ම විනය උදෙසා උන්වහන්සේ ඕන දෙයක් කරාවි. ඒ නිසා දේවදත්තයන් වහන්සේටමයි ඔය වස්ත්‍රය සුදුසු."

අන්තිමේදී සැදැහැවත් පිරිස නිහඬ වුණා. දේවදත්තගේ පක්ෂය ගත් පිරිස ජය ගත්තා.

දානයෙන් පසුව දේවදත්තට එම වස්ත්‍රය පූජා කළා. ඒ අලංකාර වටිනා වස්ත්‍රය සිවුරක් බවට පත් කළ දේවදත්ත ඉතා මැනැවින් ඒ සිවුර පොරොවාගෙන මහා තේජාන්විත ලීලාවෙන් පිරිස් පිරිවරාගෙන එහේ මෙහේ ඇවිදින්න පටන්ගත්තා. අවබෝධයෙන්ම තිසරණයෙහි පිහිටි සැදැහැවත් ගිහි පින්වතුන්ට මෙය අප්‍රසන්න දර්ශනයක් වුණා. ඒ ගිහි පින්වතුන් තැනින් තැන දොස් කියන්න පටන් ගත්තා.

"සැරියුත් මහරහතන් වහන්සේටමයි ඔය සිවුර සුදුසු වන්නේ. අනේ අපේ ඇත්තන්ට මොළේ පෑදෙන්නෙ නැති හැටි. පුද්ගලික වාසිය බලාගෙනමයි දානමාන පිරිකර දෙන්නෙත්."

මෙම කථාව හැම තැනම පැතිරුණා. බුදුරජාණන් වහන්සේ ඉදිරියේ මේ කථාව කියැවුණා. එවේලෙහි බුදුරජාණන් වහන්සේ වදාළේ,

"අතීත සසරේදීත් දේවදත්ත ඔහොම තමයි. තමාගේ වාසිය පිණිස සිවුරු පොරොවා ගෙන තියෙනවා" යැයි පවසා මේ ගාථා දෙක වදාළා.

**අනික්කසාවෝ කාසාවං - යෝ වත්ථං පරිදහෙස්සති**
**අපේතෝ දමසච්චේන - න සෝ කාසාවමරහති**

කෙලෙස් කසට බැහැර නොකොට - යමෙක් දරයි නම් කහවත
ඉඳුරන් දමනය නොකරන - ඇත්ත කථාබහ නොකරන
ඔහුට සුදුසු නැහැ කිසිවිට - දරා සිටින ඒ කහවත

**යෝ ච වන්ත කසාවස්ස - සීලේසු සුසමාහිතෝ**
**උපේතෝ දමසච්චේන - ස වේ කාසාවමරහති**

කෙලෙස් කසට බැහැර කෙරුව - සිල් ගුණදම් වලින් යුතුව
ඉඳුරන් දමනයෙන් යුතුව - සමාධිගත සිතින් යුතුව
ඇත්ත කතා කරන කෙනා - දරා සිටියි නම් කහවත
ඉතා සුදුසුමයි ඔහු හට - දරා සිටින්නට කහවත

පින්වතුනේ, පින්වත් දරුවනේ, සමහරුන් දේවදත්තට කියන්නෙ දේවදත්ත ස්වාමීන් වහන්සේ කියලයි. සමහරු දේවදත්ත තෙරුන් කියලත් කියනවා. ඒක වැරදියි. ධර්මයෙහි දේවදත්ත ගැන සඳහන් වන තැන ඔහුට කිසි විශේෂණ පදයක් යොදල නැහැ. නමින් විතරයි හඳුන්වල තියෙන්නෙ. ඒ නිසා දේවදත්ත කියලා හැඳින්වූවාම හොඳටම ඇති.

මේ දේවදත්ත කියලා කියන්නේ අමුතුම පුද්ගලයෙක්. ඉතාමත්ම මෝඩයි. ඉතාමත්ම උඩඟුයි. ඉතාමත්ම දරුණුයි. පිරිහුණු මනසක් ඇති කෙනෙක්. හැබැයි එයා හිටියේ නම් සියලු දෙයම අවබෝධ වුණු කෙනෙක් වගේ. හරියට හිතට අරගෙන හිටියා. බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය පවා බලහත්කාරයෙන් ලබාගන්නට පුළුවන් දෙයක් කියලයි මේ මෝඩ දේවදත්ත හිතුවේ. රජ පවුලේ කෙනෙක් නිසා ඉතාම ලස්සන රන්වන් සිරුරක් තිබුණා. රහතන් වහන්සේ නමක් වගේ බිමට යොමු කළ ඇස් ඇතිව ගමන් කළා. සියලු සතුන් කෙරෙහි කරුණාව දක්වන කෙනෙක් වගේ ඇඟවීම පිණිස නිර්මාංශ ආහාරයෙන් යැපුණා. තමන්ට යැපීම පිණිස අන් සතුන්ගේ ශරීර කොටස් කුස තුළ තියාගෙන මෙත් සිත වඩන්නේ කොහොමද කියා දේවදත්ත ප්‍රශ්න කළා. මෛත්‍රිය වෙනුවෙන් දේවදත්ත සටන් කළා. ඔහුගේ අසත්පුරුෂකමත්, කෙළෙහි ගුණ නොදන්නාකමත් බාහිරින් දැනගන්නට බොහෝ දෙනෙකුට බැරි වුණා.

ඉතා සූක්ෂම විදිහට අජාසත් කුමාරයාව පවා රවට්ටා ගත්තා. තමන් කියන ඕනෑම දෙයක් අනුගමනය කරන මට්ටමට ඒ කුමාරයාව හිතවත් කරගත්තා. අන්තිමේදී රජකම ගැන බොරු සැකයක් ඇති කරවලා, අජාසත් කුමාරයාට බිම්බිසාර පිය රජු ගෙන් බලෙන්ම රජකම ලබාග න්න සැලැස්සුවා. එතැනින් නතර වුනේ නැහැ. බිම්බිසාර පිය රජතුමාව තම පුතා වන අජාසත් කුමරු ලවාම ඝාතනය කරවන්නට තරම් මේ පාපමිත්‍ර සේවනය බලවත් වුණා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, දේවදත්ත සිවුරක් පොරවාගෙන හිටියත්, රහතන් වහන්සේලා මැද ඔහු වාඩි වී සිටියත්, සංවර ලීලාවෙන් පෙනී සිටියත්, චාටු බස් කතා කරමින් මිනිසුන්ව රවට්ටා

ගත්තත්, ඔහුගේ ජීවිතයෙන් පැතිර ගියේ දුගඳක්මයි. දැන් බලන්න දේවදත්තට උතුම් පැවිදි බව ලැබුණා. බුදුරජාණන් වහන්සේගේ ළඟම ඥාතියා වෙන්න ලැබුණා. රහතන් වහන්සේලා ඇසුරු කරන්න ලැබුණා. උතුම් ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කරන්න ලැබුනේ බුදුරජාණන් වහන්සේ ගෙන්මයි. ඒ ධර්මය මතකයේ රඳවාගෙනත් සිටියා. ස්වාමීන් වහන්සේලා අතරේ කල්‍යාණ මිත්‍රයෙකුගේ වේශයෙන් පෙනී සිටියා. අසත්පුරුෂකම නිසාම ඒ උතුම් ධර්මයේ අර්ථ වැටහුණේ නැහැ. ඒ අසත්පුරුෂකම අවාසනාවන්ත දේවදත්ත තුළ සසර පුරාවටම පිහිටපු එකක්.

එකමත් එක කාලෙක දේවදත්ත වැදි කුලයක උපන්නා. වැදි නායකයෙක් වුණා. සතුන් දඩයම් කරමින් ජීවත් වුණා. ඒ වනාන්තරයෙහි ඡද්දන්ත නම් හස්තිරාජයෙක් වාසය කළා. ඒ හස්තිරාජයා ඉතාමත් සුන්දරයි. මහානුභාව සම්පන්නයි. ඔප දැමූ හක්ගෙඩියක පෙනුම ඇති ඉතා අලංකාර දළ හයක් මේ ඇතාට පිහිටා තිබුනා. දෙපැත්තේ දළ තුන බැගිනුයි පිහිටා තිබුණේ. අනික් සියලු ඇතුන් මේ ඇතා පිරිවරාගෙන වනයේ ඇවිද්දා. දවසක් දඩයමේ ගිය වැදි නායකයා මේ ඇතා දැක පුදුමයට පත් වුණා. වන පඳුරකට මුවා වී ඇස්පිය නොහෙලා බලාගෙන හිටියා. ඒ ලස්සන ඇත්දළ දෙස බලාගෙන තළුමරමින් කෙළ ගිල්ලා.

"ෂා....! පුදුමාකාර ඇතෙක් නෙව. විස්මිත ඇතෙක් නෙව. කොයි ලෝකෙන් ආපු සතෙක්ද මන්දා? මගේ ජීවිතේ මෙවැනි ආනුභාව සම්පන්න හස්ති රාජයෙක්ව දැකලා නෑ. මේ ඇත්දළ කපා ගත්තෝතින් මට ආයෙ දඩයම්වලින් වැඩක් නෑ."

වැදි නායකයා සතුටින් තොල කට ලෙවකෑවා. ඊට පස්සේ ඔහු ඡද්දන්ත හස්ති රාජයා පස්සේ කුරුමානම් ඇල්ලුවා. එහෙත් ඒ ඇතා ළඟට කිට්ටු වෙන එක ලෙහෙසි නැහැ. දවසක් මේ වැදි නායකයා තව පුදුම දෙයක් දැක්කා. පඳුරකට මුවා වී බලා සිටියා. එදා ඒ ඡද්දන්ත හස්ති රාජයා දණගසාගෙන කාටදෝ වන්දනා කරනවා. විපරම් කරල බැලුවා. හරිම පුදුමයි.

මහවනාන්තරය මැද්දේ කුඩා ගල්ලෙනක ස්වාමීන් වහන්සේ නමක් වැඩසිටිනවා. උන්වහන්සේ මුළු සිරුරම සිවුරෙන් වසාගෙන සිටියා. සීතලට වෙන්න ඇති. වැදි නායකයා තව තවත් කිට්ටු වුණා.

"ඔව්... භික්ෂුවක් තමයි! ඇතා මිනිහෙකුට වඩා හීලෑ වෙලා නෙව ඉන්නේ. අර අර... මහා භක්තියකින් ඒ භික්ෂුවට වදිනවා. ඒ භික්ෂුව අර ඇතාගේ හොඬවැලට අත තිබ්බා. අර... ලස්සන ඇත් දළවලටත් අත තියලා සෙත් පැතුවා. ෂා...! මට ළං වෙන්න විදිහක් නැහැ නෙව."

ඊට පස්සේ වැදි නායකයා උපායක් කල්පනා කළා.

'මේ ඇතා දළ හයකින් යුත්තයි. විශේෂ ඇතෙක්. මිනිහෙකුට වඩා භක්තිවන්තයි. මට කරන්න තිබෙන්නේ එක දෙයයි. මමත් සිවුරක් පොරෝගන්නවා. අර භික්ෂුවගේ වේශය මමත් ගන්නවා. එතකොට මට බොහෝම පහසුවෙන් මගේ වැඩේ කරගන්න පුළුවනි.'

වැදි නායකයා ඒ භික්ෂුව කවුද කියා හඳුනන්නේ නෑ. ඒ සාමාන්‍ය භික්ෂුවක් නොවෙයි. අබුද්ධෝත්පාද කාලවලදී එනම් බුදු සසුන අතුරුදහන් වූ කාලවලදී පමණක් ලෝකයෙහි පහළ වන අසාමාන්‍ය වූ අද්විතීය වූ මහා පුණ්‍යවන්තයෙක්. පසේබුදුරජාණන් වහන්සේ නමක්. වැදි නායකයා ඒ පසේබුදුරජාණන් වහන්සේගේ සිවුරක් සොරකම් කරගත්තා. වනයෙ ඈතට ගියා. ඇත් රජා ගැවසෙන සීමාවේ අඳුරු ගුහාවකට වැදුණා. සිවුර පේන්න සැළැස්සුවා. සිවුර දුටු ගමන් ඇත් රජාට හරි සතුටුයි. ඇත්රජා හොඬය ඔසවා කුඤ්චනාද කළා. ටිකෙන් ටික සිවුර ළඟට ළං වුණා. වැද්දා ඇතා කිට්ටු වෙනකල් හිටියා. ඇත් රජාට කිසි බයක් නැහැ. පරම අවිහිංසාවෙන් යුතු පසේ බුදුරජාණන් වහන්සේගේ සිවුරේ පහස පවා ඇත් රජාට සැපයක්. ඇත් රජා ආදර භක්තියෙන් යුතුව තවත් සිවුරට ළං වුණා. වන්දනා කළා.

මුළුමණින්ම සිවුරින් ඇඟ වසා සිටි වැදි නායකයාව ඇත් රජාට පෙනෙන්නෙ නෑ. ටික වේලාවකින් සිවුර ඇතුළෙන් තියුණු ලෙස මුවහත්

කළ කියතක් එළියට ආවා. දැන් ඇත් රජා හොඬවැල දිගු කරගෙන දණ ගසාගෙන ඉන්නවා. වැද්දා අර කියතින් ඇතාගේ දළ කපන්න පටන් ගත්තා. ඇතා හිතුවේ මේ සිවුර ඇතුළේ ඉන්නේ තමන් සැමදා භක්තියෙන් වන්දනා කළ ශාන්ත සිත් ඇති උත්තමයන් වහන්සේ කියායි. ඇත් රජාට කිසිවක් සිතාගත නොහැකි වුණා. ඇත් රජා කලබල වුණේ නැහැ. ඉවසාගෙන සිටියා. ආදර භක්තියෙන් සිටියා. සියලු වේදනා උසුලාගෙන සිටියා. කෙමෙන් කෙමෙන් ඇත් දළ එක එක කපද්දී සිවුරු පොරවා සිටි වැද්දා ඇත් රජාගේ සොඬවැල පාගා ගත්තා. ලේ වැගිරෙමින් මස් සිදුරු කරමින් ඇත් දළ කපන්නට පටන් ගත්තා. ඇත් රජා මහත් වේදනාවෙන් දෑස විවර කොට බලා සිටිද්දී පෙනුණේ තමා ආදරයෙන් වන්දනා කරන සිවුර විතරයි. අන්තිමේදී ඇත් රජා පහන් සිතින් මිය ගියා. සිවුර පොරවා සිටි කෲර වැද්දා ඇත් දළ සයම කපා ගෙන ගියා. එකල ඒ උතුම් ඇත් රජා වෙලා ඉපදිලා හිටියේ අපේ බුදුරජාණන් වහන්සේ. දේවදත්ත තමයි වැදි නායකයා. දඩයක්කාරයා. ඔහුගේ ගොදුර වුණේ අහිංසක ඇත් රජා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, සමහර අවස්ථාවලදී පව්ටු සිත් ඇති පුද්ගලයන් උදාර තනතුරුවලට පත් වෙනවා. එතැන ඉඳලා ඒ පාපී පුද්ගලයා ඒ තනතුරෙන් මත් වෙනවා. ළාමක ආශාවට වසඟ වෙනවා. අන්තිමේදී ඒ තනතුරු තුළින් පව්මයි රැස් කරන්නේ. එවැනි පුද්ගලයන් රජ වෙලා, ආයතනවල ප්‍රධානීන් වෙලා බොහෝ කෙනෙකුව විපතට ඇදල දානවා. ඉතිහාසයේ ඕන තරම් එවැනි පව්ටු පුද්ගලයන් සමාජයේ නායකත්වයට පත් වෙලා අන් අයවත් වනසාගෙන තමනුත් වැනසී යන සිදුවීම් ගැන දැනගන්න ලැබෙනවා. ඒ තුළින් බොහෝ දෙනෙක් පව් රැස් කර ගන්නවා. එවැනි පව්ටු පුද්ගලයින් උදාර තැනක ප්‍රධානියෙක් වීම අවාසනාවක්මයි.

ඇත්තෙන්ම උදාර තනතුරක් ලැබිය යුත්තේ උදාර පුද්ගලයකුටමයි. උදාර පුද්ගලයා නිසා තනතුර බබලනවා මිසක්, ඒ තනතුරුට මුවා වෙලා ඔහු බබලන්නේ නැහැ. උදාර පුද්ගලයා සියලු දෙනාගේ යහපතට කැමැතියි. ඉවසන කෙනෙක්. කරුණාවන්ත කෙනෙක්. ආරවුල් සංසිඳවන කෙනෙක්. ධාර්මික කෙනෙක්. අයහපත

අත්හරින කෙනෙක්. යහපත සමඟ එක් වන කෙනෙක්. හොඳ නරක හඳුනාගන්නා කෙනෙක්. සත්පුරුෂ කෙනෙක්. කෙලෙහිගුණ දන්නා කෙනෙක්. උදාර පුද්ගලයා නිසා බොහෝ දෙනෙක් පින් කරගන්නවා. යහපත උදාකර ගන්නවා. සැපතට පත්වෙනවා. උදාර පුද්ගලයා ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලින් මත්වෙන්නේ නැහැ. ගිජු වෙන්නේ නැහැ. මහ පොළොවේ අධිපති බවට පොරකන්නේ නැහැ. නොඇලුණු සිතින් ඉන්නා කෙනෙක්.

අයහපත් පුද්ගලයා විවිධාකාර වෙස්ගන්නා හෙයින් හඳුනාග න්නට අසීරුයි. බොහෝ දෙනෙක් රැවටෙනවා. ඔහු තම කාර්යය උදෙසා විවිධ චාටුබස් කියනවා. විවිධ වෙස් ගන්නවා. බොරුවෙන් ඇත්ත වහනවා. පිරිස බිඳවනවා. කුමන්ත්‍රණ කරනවා. අවස්ථාව ලද විගස පළිගන්නවා. ඔහු ගුණමකුයි. කෙලෙහි ගුණ දන්නෙ නැහැ. සමාජ ආධිපත්‍යයට ආශා කරනවා. ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවලට වසඟ වෙනවා. ඊර්ෂ්‍යාවෙන් පෙළෙනවා. ඕනම පවිටු දෙයක් කිරීමට පෙළඹෙනවා. එනිසා අසත්පුරුෂ බාලයන් හා ඇසුරු නොකළ යුතුමයි. සත්පුරුෂ කල්‍යාණ මිත්‍රයන් පමණක් ඇසුරු කිරීමෙන් සලසාගත හැකි යහපත වචනයෙන් කිව නොහැකි තරම් අතිවිශාල දෙයකි.



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*තිසරණ සරණයි!*

*ආදරණීය පුතේ,*

*ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව යටතේ ශ්‍රද්ධා මාධ්‍යජාලය හරයා ඔබ විසින් එවන ලද ලිපිය ලද බව ස්තූති පූර්වකව දන්වා සිටිමි. මුළින්ම මා ඔබගේ අධ්‍යාපන කටයුතු සහ අනාගත බලාපොරොත්තු සර්වාකාරයෙන්ම සාර්ථක වේවායි ශුභාශිංසනය කරමි.*

*ආදරණීය පුතේ, මා දැනට 70 වන වියේ පසුවන විශ්‍රාමික ගුරුවරියක වෙමි. දැන් මා හට ලිපි ලිවීම තරමක දුෂ්කර කාර්යයක් වුවත් ඔබව දිරිමත කිරීමට එක ලිපියක් හෝ ලිවීම මගේ යුතුකමක් සේ සලකා මෙය ලියන්නට සිතුවෙමි.*

*පළමු වසරේ සිසුවෙකු ලෙස ඔබගේ ප්‍රගති වාර්ථාව විමසද්දී ඔබට ඉදිරියට යාමට හැකි දරුවෙකු බව මට හැඟී ගියා. මෙම තත්වය දිගටම පවත්වා ගනිමින් පළමුපෙළ සාමාර්ථයක් ලබා ගැනීමට උත්සාහවත් වන්න. ඒ සඳහා ඔබට අනවශ්‍ය අවශ්‍යතා ඉවත දමා අත්‍යාවශ්‍යම අවශ්‍යතා ගැන පමණක් උනන්දු වන්න. මා මෙසේ පවසන්නේ විශව විද්‍යාලයේ දී බොහො විට අවශ්‍ය යයි හැගෙන බොහෝ දේ අපේ ජීවිත ගමන වෙනස් මගකට හරවා අපව වල්මත් කරන දිශාවකට යොදවන නිසයි. කුමන අවස්ථාවක දී හෝ තීරණ ගැනීමේ දී හදවතට වඩා බුද්ධියට තැන දෙන්න. තනිවම විසඳා ගත නොහැකි ප්‍රශ්න හා ගැටළුවලදී වල්මත් නොවී මහමෙව්නාවේ ස්වාමීන් වහන්සේලාගෙනුත් ඔබගේ දෙමව්පියන්ගෙනුත් අවශය පිළිසරණ ලබා ගන්න. බොහෝ විට ප්‍රශ්න හමුවේ යහළුවන්ගෙන් උපදෙස් ගන්න යන බොහෝ*

දෙනා අමාරුවේ වැටුන අවස්ථා මා දන්නා බැවිනි. දිගු කල් ගුරු වෘත්තියේ නියැලුන මා හට ඒ පිළිබඳ මනා අවබෝධයක් තිබේ. මගේ සොහොයුරෙකුගේ දියණියක් මා ඇය උපන් දා පට හදා වඩා ගත්තෙමි. ඇයට අවශ්‍ය සියලු මගෙපෙන්වීම් මා විසින් කරන ලද අරත ඇය මහමෙව්නාවෙන් බොහෝ ආදර්ශ ලබා ජීවිතය ජයගත් අයෙකි. ඇයද විශ්ව විද්‍යාලයට ඇතුළත්ව මූල්‍ය කළමනාකරණය හදාරා පළමුපෙළ සාමාර්ථයක් ලබා ගත්තේ ද, විවාහය සඳහා සුදුසුම පුද්ගලයෙකු තෝරා ගත්තේ ද එම නිසයි. බොහෝ දියණියන් අනුකරණ පසුපස දිව යද්දී සරල ජීවිතයකට හුරු වීමද ජයග්‍රහණයට හේතු විය.

ආදරණීය පුතණුවනි, වසර 13ක් තිස්සේ පොත් රැදෙමින් ඉතා අමාරුවෙන් ජයගත් විශ්ව විද්‍යාල සිහිනය අනාගත ජීවිතයේ සිහින සැබෑකර ගැනීමට යොදා ගන්න. විශ්ව විද්‍යාලයේදීත් ඇසුරට සුදුසු අය පමණක් ලං කරගන්න. බුද්ධිමත්ව සිහියෙන් කටයුතු කළහොත් එය එතරම් අපහසු කරුණක් නොවේ.
ඉතින් පුතේ, දැන් මා නවතින්නම්. ඔබටත් ඔබගේ දෙමාපිය සහෝදර සහෝදරියන්ටත් නිවැසි අන් සියලු දෙනාටත් තිසරණ සරණින් දෙව් රැකවරණින් නිදුක් නිරෝගී සුවපත් වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

තෙරුවන් සරණයි !

මෙයට,
කැපකරු අම්මා.

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහනක්...

*නමෝ බුද්ධාය!*

*"ඒ භාගයවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා! "*

*ගෞරවනීය පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍යජාලයේ පින්වත් අනුශාසක ස්වාමීන් වහන්සේටත්, මාගේ නමස්කාරය වේවා! ශ්‍රද්ධා මාධ්‍ය ඒකකයෙන්, ලක්විරු ගුවන්විදුලියෙන් සියලුම කාර්ය මණ්ඩලයටත්, ශ්‍රද්ධා ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතියේ දයාබර කාර්ය මණ්ඩලයේ සැමටත්, මාගේ ආදරණීය කැපකරු මව්පිය දෙපල ඇතුළු සියලුම මව්පියන්ටත්, නිදුක් නිරෝගී සුවයත්, ගෞතම බුදුන්ගේ පිහිටත් ආරක්ෂාවත් ලැබේවා!*

*පුරා වසර දෙකකට අධික කාලයක් කැපකරු මව්පියන් දෙපළ මාගේ අධ්‍යාපනය වෙනුවෙන් ඔවුගේ දහඩිය, කඳුළු හෙලා උපයාගත් මුදල පින් සිතින් යුතුව ප්‍රධානය කළා. එමෙන්ම ශ්‍රද්ධා මාධ්‍යජාලයේ ගරු අනුශාසක ස්වාමීන් වහන්සේ මූලික වී මාගේ අධ්‍යාපනයට අවශ්‍ය මිල අධික දිය සායම් කට්ටලයක්, පින්සල්, ධර්ම ග්‍රන්ථ වගේම, කොළඹ අක්ෂි රෝහලේ වෛද්‍ය දීපිකා මහත්මිය මූලික වී මාගේ පියාගේ දෑසේ සුද තත්වයද ඉවත් කර දීමට කටයුතු කරනු ලැබුවා. වචනයෙන් මිල කළ නොහැකි උදව් උපකාර රාශියක් කළ ඔබ වහන්සේලාටත්, මාගේ කැපකරු මව්පියන්ටත් බොහෝම පිං වේවා'යි මම ප්‍රාර්ථනා කරනවා.*

*ගරු ස්වාමීන් වහන්ස, වසර දෙකක් පමණ වූ මාගේ කැපකරු මව්පියන් සමග වූ බැඳීම උසස් පෙළ නම් කඩඉම් විභාගය නිසා නතර වූවත් විශ්ව විද්‍යාල වරම් ලබා ගැනීමට මා වාසනාවන්ත වූවත් නැවතත් මට ඒ මව්පිය සෙවණේ නතර*

විය හැකිය. කෙසේ වුවද මාගේ දෑස පෑදීමට ගත් උත්සාහය වෙනුවෙන් මාගේ කෘතවේදීතාව පුද කරනවා.

එමෙන්ම මෙවර "ශ්‍රද්ධා තක්සලාව" දකුණු පළාතට රැගෙන ඒම පිළිබඳව මාගේ ස්තූතිය පුද කරනවා. මමත් එම වැඩසටහන සහභාගී වීමට බලාපොරොත්තුව සිටිනවා. එමෙන්ම මා දිනපතාම ආනන්ද මහරහතන් වහන්සේටත්, සාරිපුත්ත මහරහතන් වහන්සේත් වන්දනා කරනවා.

මාගේ මව නිතරම ලොකු ස්වාමීන් වහන්සේගේ එම "පින් මතුවෙන වන්දනා" පොතේ ගාථාවන් පාඨ නිතරම පවසනවා. ඇයට එම ධර්ම පුස්තකයට විශාල ගෞරවනීය ඇල්මක් තියෙනවා. ඇවිදීමටද අපහසු මාගේ මවගේ ආශාව ඉටු කිරීමට මා අදහස් කරමි. මම, මාගේ මවත්, පියාත්, විභාගය අවසන් වීමෙන් පසුව කෙසේ හෝ කඩුවෙල මහමෙව්නාව භාවනා අසපුවට පැමිණීමටත් බලාපොරොත්තු වෙනවා. අවසාන වශයෙන් දයාබර කැපකරු මවගේ, පියාගේ උණුසුමටත් අයාබරත්වයටත්, පරිත්‍යාගශීලි බවටත් මාගේ කෘතවේදීතාවය. ලොකු ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍යජාලයේ අනුශාසක ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍යජාලයේ සියලුම දෙනාටත් සිතූ පැතූ සියලු කාර්‍යයන් එලෙසම සඵල වේවා!

බුදු සරණයි !

මෙයට කැපකරු දියණිය.

### තෙරුවන් සරණයි!

සෙනෙහෙබර කැපකරු දෙමව්පියණි,

ඉතිං අමේ තාත්තේ 2015 සාමාන්‍ය පෙළ විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වූ මා හට 2016 සිට මෙම මස දක්වා ලබාදුන් ශිෂ්‍යාධාර මුදල මාගේ අධ්‍යාපන ගමනට මහත් සවියක් ගෙනදුන් බව කිවයුතුමය. එදා වේල සරිකර ගන්නට දෑතේ දෙපයේ ශක්තිය කැප කරමින් වෙහෙසෙනා මගේ අහිංසක අම්මට, අප්පච්චිට ඔබ මට ලබාදුන් මුදල මහමෙරකි. ඔබ ද ඒ මුදල සොයා ගන්නේ ඉතා වෙහෙස මහන්සි වී බව මම දනිමි. ඉතිං කැපකරු දෙමව්පියනි, මාගේ හදපිරි ස්තූතිය හා ඔබ සිතන පතන කටයුතු ඉටුවේවා යැයි මා පතනුයේ බැතිබර සිතිනි.

මෙම කර්තව්‍ය සිදු කිරීමට ඔබට මා හඳුන්වාදුන් ශ්‍රද්ධා මධ්‍ය ජාලයට හා පින්වත් ලොකු ස්වාමීන් වහන්සේද සිහිපත් කරනුයේ ස්තූතිපූර්වක සිතිණි.

ඉතින් කැපකරු දෙමව්පියනි, මා දිවියෙහි ඉතා වැදගත් වූ පරිච්ඡේදයක් දැන් උදා වී ඇත. එනම් මෙවර උසස් පෙළ විභාගය යි. මා වසර දෙකහාමාරක් උදේ දවල් රෑ එළිවෙනා තුරු නොනිදා ඇප කැප වූයේ මේ වෙනුවෙනි. අනිත් ළමුන් විචිත්‍රවූ ඇඳුම් මෝස්තර, කොණ්ඩ මෝස්තර කරමින් ස්මාට් ජංගම දුරකතනය අතැතිව ළමා ලොවට උචිත නොවන දෑ කරද්දී සාමාන්‍ය ලෙස දිවිගෙවමින් හොඳින් පාඩම් කරමින් පන්තිවල, පාසලේ විභාගයෙන් පන්තියේ වැඩිම ලකුණු ගත් විටද ඇතැම් විට අප ඔවුනට විහිළුවක් විය. මට සෑම විටම සිහි වූයේ මගේ දෙමව්පියන්ගේ අහිංසක මුහුණු ය. මා සියල්ල ඉවසා සැමදා මගේ උපරිමය අධ්‍යාපනය තුළින් ලොව දිනන්නට කාලය මිඩංගු කළෙමි. මෙසේ ගෙවුණු වසර දෙකක කාලය දැන් හමාර වී ඇත. මාගේ එකම අරමුණ මෙවර උසස් පෙළ විභාගයෙන් සමත්ව සරසවි වරම් ලබා ගැනීමයි. මාගේ අරමුණට යාමට හැකිබව මා දනිමි. ඉතින් කැපකරු දෙමව්පියනි, මා හට ඔබ වෙනුවෙන් කළ හැකි එකම දෙය එයයි. නැවත විභාග ප්‍රතිඵල ඔබට දන්වා එවන බලාපොරොත්තුවෙන් මම මින් නවතිමි. ඔබ ඇතුළු පවුලේ සැමට තෙරුවන් සරණයි!

මෙයට කැපකරු දියණිය.



# සේරිවාණිජ ජාතකය

සේරි නම් වූ වෙළෙන්දාගේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

ඔබ කවුරුත් මේ ලස්සන ජාතක කථාව කලින් අසා ඇති. ඒ ජාතක කථාවට පසුබිම් වෙලා තියෙන්නේ අපි මෙතෙක් නොදත් වටිනා උපදේශයක්. ඒ මෙහෙමයි.

ඔන්න බුද්ධ කාලේ සැවැත් නුවර එක්තරා සැදැහැවත් තරුණයෙක් සිටියා. මොහු වරින් වර බණ අහන්නට දෙව්රමට යනවා. ටිකෙන් ටික හිතේ පැහැදීම වැඩි වුනා. පැවිද්දට හිත ගියා. ගිහි ජීවිතය අත්හැර පැවිදි වුනා. භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අවවාද ගත්තා. හුදෙකලාවේ වීර්යය වැඩීම පිණිස වනගත වුනා. එහෙත් ඒ භික්ෂුව ගේ සිත සමාධිමත් වුනේ නෑ. එතකොට ඒ ගැන කලකිරුනා. කුසල් වැඩීම අත්හැරියා. ප්‍රමාදයෙන් කල් ගෙව්වා. විහිලුවෙන් කල් ගෙව්වා. එතකොට වැඩිහිටි භික්ෂූන් වහන්සේලා එහෙම කරන්න එපා කියලා ඒ භික්ෂුවට අවවාද කළා. උත්සාහවත් වෙන්න කිව්වා. මේ ලද දුර්ලභ අවස්ථාව අත්හැර ගන්න එපා කිව්වා. ඒත් හරි ගියේ නෑ. අන්තිමේදී භික්ෂූන් වහන්සේලා ඒ භික්ෂුව අකමැත්තෙන් ම භාග්‍යවතුන් වහන්සේ වෙත කැඳවාගෙන ගියා. භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුව ගෙන් විමසුවා.

"හැබෑද භික්ෂුව.... දැන් ධර්මයේ හැසිරෙන්න උනන්දුවක් නැද්ද.....? වත් පිළිවෙත් කරන්න උනන්දුවක් නැද්ද......? නිකාම්ම නින්දෙන් කල් ගෙවනවා කියන්නේ...... පිරිසත් එක්ක කතාවට වැටිලා විහිලුවෙන් කල් ගෙවනවා කියන්නේ....? හැබෑද....?"

"එහෙමයි.... ස්වාමීනී."

"භික්ෂුව..... ඉස්සර එක්තරා කදාවළලු වෙළෙන්දෙක් සිටියා. දවසක් ඔහු වෙළඳාමේ යද්දී කහවණු ලක්ෂයක් වටිනා රන්තැටියක් හම්බ වුනා..... ඔහුට ඒ වෙලාවෙ ඒ රන් තැටිය ගන්න අවස්ථාව තිබුනා. නමුත් ඒක තමන් පහුවෙලා ඇවිත් ගන්නවා කියලා

අත්හැරියා. පස්සෙ වෙන වෙළෙන්දෙක් ඇවිත් ඒක අරං ගියා. මොහු ආපසු ඇවිත් බලද්දී ඒක නෑ. තමන්ට වූ පාඩුව ගැන උහුලාගත නොහැකි ශෝකයකින් දුකට පත්වුනා..... භික්ෂුව, ඔබත් ඒ පාඩු ලැබූ වෙළෙන්දා වගේ වෙන්නද යන්නෙ? සතර අපායෙන් මුදවා මගඵල සැප උදා කරන උතුම් බුදු සසුන ලැබුන වෙලාවෙ ඇයි මේ ක්ෂණ සම්පත්තිය අහිමි කරගන්නෙ.... පස්සෙ පසු තැවි තැවී ඉන්නද කල්පනාව.....?"

එතකොට භික්ෂූන් වහන්සේලාට ඒ පාඩු ලැබූ කදාවළලු වෙළෙන්දා ගේ කථාව අහන්න ගොඩාක් ආසා හිතුනා. රන් තැටියක් අහිමි කරගෙන ශෝක වුන වෙළෙන්දා ගේ කථාව කියාදෙන්න කියලා භාග්‍යවතුන් වහන්සේට ආයාචනා කළා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

දේවදත්ත අපගේ මහාබෝසතාණන් පසුපස්සේ පළිගනිමින් එන කථාවේ ආරම්භය වෙන්නේ මේ සේරිවාණිජ ජාතකයෙන්. මේ සිද්ධිය වුනේ මෙයින් පස්වෙනි කල්පයකට පෙරයි. අසංඛෙය්‍ය කල්ප සතරකුත් කල්ප ලක්ෂයක් පුරාවට අප මහ බෝසතුන් පාරමී පිරුවා. ඒ සා දීර්ඝ කාලයක් දේවදත්තයා පසුපසින් ආවේ නෑ. බුද්ධත්වය ලබන්න කල්ප පහකට කලින්නුයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ. ගොඩාක් අය සිතාගෙන ඉන්නෙ අසංඛෙය්‍ය කල්ප ගණන් දේවදත්තත් පස්සෙන් ආවා කියලා. නෑ.... එහෙම වුනේ නෑ.

ඉතින් මීට කල්ප පහකට කලින් අපේ බෝධිසත්වයෝ සේරිව කියන රටේ කදාවළලු වෙළෙන්දෙක් වෙලා හිටියා. ඒ රටේම සේරී කියල තවත් කදාවළලු වෙළෙන්දෙක් හිටියා. හැබැයි මේ සේරී වෙළෙන්දා හරිම ආත්මාර්ථකාමීයි. තමන් ගැන විතරයි බලන්නේ. හරි කපටියි. ලෝභකමෙන් යුක්තයි.

ඉතින් මේ දෙන්නා නීලවාහිනී කියන ගංගාවෙන් එතෙර වෙලා අන්ධපුර කියන නගරේ වෙළඳාම් කළා. ඔවුන් වෙළඳාම්

කරද්දී දෙන්නා කතා වෙලා නගරේ වීදි බෙදාගත්තා. තම තමන්ට ලැබුනු වීදිවල වෙළඳාම් කළා. තමන්ට නියමිත වීදියේ ඉස්සෙල්ලාම වෙළඳාමේ යන්ට පුළුවන් වුනේ ඒ අදාළ වෙළෙන්දාට යි. අනිත් වෙළෙන්දාට යන්න පුළුවන් වුනේ ඊට පස්සෙයි.

දවසක් සේරි වෙළෙන්දා එක්තරා වීදියක වෙළඳාමේ ගියා. ඒ වීදියේ පරණ සිටු නිවසක් තිබුනා. ඒ සිටු පවුල දැන් ගොඩාක් දුප්පත් වෙලා. දැන් ඒ ධනවත් නෑදෑ සහෝදර කවුරුවත් නෑ. එක් මිත්තණියකුයි මිනිබිරියකුයි විතරයි ඒ නිවසේ ඉන්නේ. 'කදාවළලු.... කදාවළලු....' කියමින් මේ සේරි වෙළෙන්දා කෑ ගසාගෙන යද්දී අර මිනිබිරියට ඒ හඬ ඇසුනා. ඈ නිවසින් එළියට ආවා. පාර දිහා බලාගෙන හිටියා. ආයෙමත් කලබලයෙන් ගෙට දිව්වා.

"අනේ.... මගේ මිත්තණියනේ.... ආන්න.... කදාවළලුකාරයෙක් එනවෝ...... අනේ..... මටත් කදාවළලු ඕනා...... අනේ..... මටත් හරී ආසයි.... ඒවා හරී ලස්සන වළලු....!"

"අනේ මයෙ කෙල්ලේ.... ඕවා හරී ගණන් නොවැ.... ඇරත් අපට ඕවා ගන්ට සල්លි කොහින්ද මයෙ දුවේ..... දැන් බලාපන්..... අපි එදා වේල හොයාන කන්නෙත් අනුන්ට බැල මෙහෙ කොරලා නොවැ...."

එතකොට මිනිබිරී මුහුණ හකුලා ගත්තා. සිඟිති ඔලුව ගැස්සුවා. දෑසේ කඳුළු පුරෝගත්තා. ආයෙමත් කෙඳිරි ගාන්න ගත්තා. කදාවළලු හඬ ළඟ ළඟ ඇහෙනවා. කුඩා දියණිය තවත් කලබල වුනා. ඈට අමුතු නුවණක් පහළ වෙලා වගෙයි. ඈ වහා ගේ ඇතුලේ පරණ වළං ගබඩාවට දිව්වා. මල බැඳුනු තැටියක් අරගෙන ආවා.

"මේ.... මේ..... අනේ මිත්තණියෙනි..... මේ අපේ මුත්තා බත් වළඳපු භාජනේ තියෙන්නෙ.... ඉතින් අපි මේක දෙමුකෝ.... දීලා වළල්ලක් ඉල්ලා ගනිමුකෝ....."

"අනේ.... කෙල්ලේ.... අපි කොහොමෙයි දන්නෙ.... ඔය වෙළෙන්දා ඕක ගත්තොත් හොඳා.... නැත්නම් මොකදෑ කොරන්නේ?"

"අනේ.... මිත්තණියේ..... මේක නොගෙන ඉන්න එකක් නෑ. මං ඒ වෙළෙන්දාට අඬ ගහන්නම්...." කියලා මිණිබිරී අර වෙළෙන්දාව පරණ දිරා ගිය සිටු නිවසට අඬ ගසාගෙන ආවා. එතකොට මිත්තණිය ඒ වෙළෙන්දාට මෙහෙම කිව්වා.

"අනේ.... පින්වත..... මේ මයේ කෙලී වළල්ලක් ඉල්ලලා හඬනවා. මට බේරෙන්න බැහැ...... අනේ මයෙ පුතේ..... මේ පරණ තැටියක් තියෙනවා. ඕක අපේ පරම්පරාවෙන් ආපු එකක්..... ඉස්සර මේ කෙලී ගෙ මුත්තලා බත් කාපු තැටිය.... මේන්න මේක.... ඔය තැටිය අරන් මේ දැරිවිට මොකවත් දීපං පුතේ..."

ඉතින් සේරි වෙළෙන්දා අර තැටිය අතට ගත්තා. ඉදිකටු තුඩින් තැටිය සූරලා බැලුවා. හැබෑම රත්තරන් තැටියක්! එතකොට මහා ලෝභකමක් හටගත්තා. කිසිවක් නොදීම බාල බඩු වගේ පෙන්නලා තැටිය ගන්ට ඕනා කියල සිතුවා. ඒ තැටිය පැත්තට වීසි කරා......

"හාපෝ..... මේකේ කිසි වටිනාකොමක් නැහැ. අඩ මස්සක් තරම්වත් වටින්නේ නැහැ. මේකට නම් මොකුත් දෙන්ට විදිහක් නම් නැහැ. වටිනාකොම බොහොම අඩුයි" කියලා තමන් ගේ වළලු කදත් ඉනේ රඳවාගෙන පිටත් වුනා. කඳුලු පුරවාගත් නෙතින් යුතු මිණිබිරිය ඒ වළලු දෙස බලාගෙන හිටියා. මිත්තණිය මිනිබිරිය ගේ ඔලුව අතගෑවා. ඒ බිම දමාපු තැටිය රැගෙන නැවතත් වළං ගොඩේ දැම්මා.

ටික වේලාවකින් තවත් වෙළෙන්දෙකු ගේ හඬ ඇහෙනවා. " කදා වළලු.... කදා වළලු...." කියන හඬ ඇහෙනවා. පැත්තට වෙලා ශෝකෙන් වාඩි වී සිටි කෙලී ආයෙමත් නැගිට්ටා. ගෙයින් එළියට පැන්නා. වැට ළඟට දිව්වා. පාර බලා ඉන්නවා. මේ වෙළෙන්දා

එහා ගෙදර මිනිස්සුත් එක්ක ආදරයෙන් කතා කරනවා. පෙනුමත් අහිංසකයි. ඈ ආයෙමත් මිත්තණිය ළඟට දිව්වා.

“අනේ.... මිත්තණියේ..... තව වෙළෙන්දෙක් එනවා....... අපි මෙයාට අර තැටිය දීලා වළල්ලක් ඉල්ලා ගනිමු.”

“අනේ පැටික්කියේ...... ඔය වෙළෙන්දෝ මට නම් විශ්වාස නැහැ....... දැක්කා නේ කලින් ආපු මනුස්සයා. තැටියත් වීසි කොරලා..... ගස්සාගෙන..... කෑගසලා ගිය හැටි. මේ මනුස්සයත් එහෙම කොරාවි.”

“අනේ මිත්තණියේ..... මේ වෙළෙන්දා නම් හොඳ කෙනෙක් වගෙයි...... අනේ මිත්තණියේ මං අඬගහන්නම්...... අනේ..... අපි මේ වෙළෙන්දාටවත් අර තැටිය දීලා බලමු.”

“හොඳයි... එහෙනම්... අඬගහපන් බලන්න.”

එතකොට මිණිබිරී ආයෙමත් වැට කඩුල්ල ළඟට දිව්වා. අර වෙළෙන්දාට කතා කළා. වෙළෙන්දා සිටු නිවසට ඇවිත් වළලු කද බිමින් තිබ්බා.

“අනේ දරුවෝ.... අපේ මේ කෙලීගෙන් මට බේරෙන්න විදිහක් නැහැ නොවැ..... වළල්ලක් ඉල්ල ඉල්ලා හඬනවා..... ඉතින් මයෙ දරුවෝ..... මේකට නම් බැහැ නොකියා වළල්ලක් දීපං.... මේන්න මේ තැටිය තමයි අපට තියෙන්නේ. කාසි මොකුත් නෑ. ඔය තැටිය පුරාණ එකක් පුතේ. මේ මිණිබිරී ගේ මුත්තලා බත් කාපු තැටිය. ඉතින් මේක අරගෙන ඔය මොනවා හරි පොඩි දෙයක් දුන්නාම ඇති පුතේ......”

එතකොට බෝසත් වෙළෙන්දාත් ඒ තැටිය අතට ගත්තා. ඉදිකටු තුඩකින් ඉරක් ඇඳලා බැලුවා. දෑස් උඩ ගියා. අතක් නළලේ තබා ගත්තා.

"අපෙ අප්පෝ....... ආච්චියේ.... මේක රන් තැටියක් නොවැ. මේක රන් කහවණු ලක්ෂයක් විතර වටිනවා..... මේකට සරිලන්න වස්තුව අපි ළඟ කොයින් ද....!"

"හැබෑට පුතේ.... ඕක එච්චර වටිනවැයි.....! හනේ.... ඒකට..... මීට කලින් ආපු වෙළෙන්දා ඔය තැටිය අතට අරගෙන මටත් රවලා, කෙලීටත් රවලා, අඩ මස්සක් වත් වටින්නේ නෑ කියලා බිම අතෑරලා ගියා නොවැ..... හහ්..... මයෙ පුතේ..... නුඹේ පිනට වෙන්නැති මේක රත්තරන් වුනේ..... අනේ පුතේ.... නුඹ ඔය තැටිය ගනින්. අපේ මේ කෙලීට වළල්ලක් දීපං පුතේ...."

"ආච්චියේ..... මා ළඟ මුදලින් කහවණු පන්සීයක් තියෙනවා. මේ වළලු මාලවල වටිනාකමත් කහවණු පන්සියයයි. මේ ඔක්කොම මං දෙන්නම්..... මට මේ තරාදියයි..... මේ වළලු දාන පෙට්ටියයි..... කහවණු අටකුයි දෙනවාද ආච්චියේ."

"ගනින් පුතේ.... ගනින්.... නුඹට බොහෝම පිං පුතේ...... අපි මහා රැවටිලිකාරයෙකුට හසු නොවී බේරුනේ නුඹ නිසා පුතේ....."

ඉතින් බෝසත් වෙළෙන්දා ඒ ටික අරගෙන ගං තෙරට ගියා. තොටියාට කහවණු අට දුන්නා. ඔරුවේ නැගලා පිටත් වුනා. එතකොට සේරී කියන වෙළෙන්දා ආපහු අර පරණ සිටු ගෙදර ආවා.

"කෝ.... මේ ගෙදර හිටපු අර කෙලී...... කෝ..... අර ආච්චි....." එතකොට ආච්චි එළියට ආවා. කෙලීත් ආච්චිගේ අතේ එල්ලිලා හිටියා.

"ඇයි.... මොකද....?"

"අර තැටි කබල ගෙනෙල්ලා..... මං මොකවත් දීල යන්ටයි ආවේ..... මේ කෙලී පව් නොවැ."

"අෑ බොල.... වෙළෙන්ද....! හා.... දැන් ද මේ කෙලී පව් වුනේ. රන් කහවණු ලක්ෂයක් වටිනා රන් තැටිය......... අඩ මස්සක්වත් වටින්නෙ නෑ කියලා වීසි කොරල ගියා........ නුඹ වගේ නොවෙයි. මනුස්සකං තියෙන වෙළෙන්දෙක් ආවා...... අනේ ඒ දරුවා..... සල්ලියි බඩුයි ඔක්කොම අපට දුන්නා. රන් තැටිය අරං ගියා!"

එතකොට සේරී වෙළෙන්දා ඉනේ රුවාගෙන හිටිය බඩු පෙට්ටිය බිම වැටුනා. තමන්වත් බිම ඉන්දුනා. දණ ගැස්සුනා. ඇස් නිලංකාර වෙලා ගියා. ටික වෙලාවකින් ආයෙ සිහි උපන්නා.

"හෑ..... හෑ..... ආයෙත් කියාපිය.... මොකාද ඒ මගේ රන් තැටිය අරන් ගියේ...... හයියෝ..... තොපි ඒක කාටෙයි දුන්නේ.....?"

"ඒ මනුස්සයා හොඳ වෙළෙන්දෙක්..... නුඹ ගිහිං ඒ වෙළෙන්දාගෙන් වෙළඳාම ඉගෙන ගනිං."

"හරි.... හරි..... කෝ..... ඒකා...... කොහේ ද ගියේ..... හයියෝ.... මගේ රන්තැටිය අරන් ඒකා කොහේද ගියේ කියාපිය."

එතකොට මිනිබිරී අෑතට අත දික්කළා.

"අනේ ඒ හොඳ මාමා.... ආන්න ඔරුවේ නැගිලා යනවා."

සේරී වෙළෙන්දට උන්හිටි තැන් අමතක වුනා. පපුවට අත් ගසා ගත්තා. තරාදියේ තැටි දෙක ගලෝල වීසි කළා. තරාදි දණ්ඩ මුගුරක් වගේ අතින් මිට් මොලෝගත්තා. දත් කූරු කෑවා. ඇස් ලොකු කරගත්තා. කලබලයෙන් නැගිට්ටා. පාවහන් දෙක වීසි කළා. තමන් ළඟ තිබ්බ හැම දේම එතැන දැම්මා. එක හුස්මට ගඟ දිහාවට දිව්වා. ගං තෙරට ගිහින් යටි ගිරියෙන් කෑ ගැසුවා.

"ඒයි.... තොටියෝ.... මෙහෙ වර.... මෙහෙ වර....." කියලා

තරාදි දණ්ඩ අතින් මිටි මොලවාගෙන කෑගැහැව්වා. එතකොට බෝසත් වෙළෙන්දා තොටියාට මෙහෙම කිව්වා.

"තොටිය.... ඒ වෙළෙන්දා ඉන්න විදිහ එතරම් හොඳ නෑ. මං ගැන ලොකු වෛරයකින් වගෙයි. දැන් ඔබ හරවාගෙන ගියොත් මාව විනාශ කරාවි..... ඒ නිසා ඔරුව හරවන්න එපා. අපි එතෙරට ම යමු."

තොටියා ඔරුව හරවාගෙන ආවෙ නෑ. දිගට ම එතෙර ගියා. ඔහු ගේ අතට කහවණු අටක් ලැබිලා තියෙන්නේ. ලොකු ගණනක් දීපු කෙනාගේ බසට අවනත වෙන්න වෙනවානේ. ඔරුව ඈතට යනවා. සේරි වෙළෙන්දා ගං තෙර දණ ගසාගෙන අර තරාදි දණ්ඩ අත්හැරියා. දෑතේ ඇඟිලි විහිදුවලා වැල්ලට අත් දෙක එබුවා. කිටි කිටියේ වැලි ගොඩක් මිටි මොලවා ගත්තා. අත් දෙක එසෙව්වා. දත් කූරු සපමින් ඈත බලා ඉන්නවා. ඇස් රතු වෙලා. බිහිසුනු පෙනුමක් ඇවිත්. කඳුලු වැගිරෙනවා. තමන් ගේ දෑස් ඉදිරියේ පෙනෙන්නේ අර වෙළෙන්දා ගඟෙන් එතෙර වීම පිණිස ටිකෙන් ටික එතෙරට ළං වීම යි. දිගට එක හුස්මට බලා සිටිද්දී මොහුගේ පපුව හිර වුනා. මහා කැස්සක් ආවා. කටින් ලේ වමනේ ආවා. එතැනම මැරී වැටුනා. බෝසත් වෙළෙන්දා කෙරෙහි මහා වෛරයක් ඇති කරගෙන මැරී වැටුනා.

ඇත්තෙන්ම පින්වතුනේ, පින්වත් දරුවනේ,

මේ සේරි වෙළෙන්දා සුහදව බෝසත් වෙළෙන්දා ගෙන් ඉල්ලා සිටියා නම් අඩුගණනේ ඒ රන් තැටිය අලෙවි කොට ලබන මුදලෙන් කොටසක් වත් ඉල්ලා ගන්න තිබුනා. නමුත් ඔහු ගංතෙරට ආවේ හොඳ සිහියෙන් නොවෙයි. දරුණු කෝපයකින්. ඒ අවස්ථාවේ බෝසත් වෙළෙන්දා ළඟ සිටියා නම් අනිවාර්යයෙන් ම නැති කරනවා. බෝසත් වෙළෙන්දා නුවණින් කටයුතු කළ නිසයි බේරුනේ.

ඉතින් මේ අතීත කථාව වදාළ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් වදාළා.

"දැන් බලන්න පින්වත් මහණෙනි.... අර සේරි වෙළෙන්දාගෙ අතට යි ඉස්සෙල්ලාම රන්තැටිය ලැබුණේ. ඔහුට ඒක ගන්න තිබුනා. ඔහු තුළ ගුණධර්ම නැතිකම ඒකට බලපෑවා. ඒ නිසා රන්තැටිය අහිමි වුනා. මේ සසුනෙ රන්තැටිය තමයි මේ උතුම් නිවන් මග. ගුණධර්ම තුළින් උත්සාහ නොකරන කෙනෙක්ට කොහොමද දියුණුව ලැබෙන්නෙ? ගුණදහමින් යුතු, නුවණින් යුතු යහපත් වෙළෙන්දා රන්තැටියට හිමිකරු වුනා. දැන් මගේ සසුනේ හිමිකාර බව ලැබෙන්නේ එබඳු අයටයි. බලන්න.... ඒ කාලේ අඥාන වෙළෙන්දා වෙලා හිටියේ දේවදත්ත. නුවණැති වෙළෙන්දා වෙලා හිටියේ මම."

මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේ නිවන්මග ඉස්මතු කරමින් ධර්මය වදාළා. චතුරාර්ය සත්‍යය මැනැවින් කුළු ගන්වා වදාළා. එතකොට අර භික්ෂුවට අකුසල් බැහැර කිරීමේ වීරිය උපන්නා. කුසල් වැඩීමේ වීරිය උපන්නා. මගඵල පිළිවෙළින් අර්හත්වයට පත්වුනා. මේ ජාතක කතාව ඇසූ බොහෝ දෙනෙකුට ක්ෂණ සම්පත්තිය අහිමි කරගැනීමේ දෝෂය ඉතා හොඳින් වැටහුනා. ගුණධර්ම රැකගෙන කටයුතු කිරීම නිසා යහපත උදාකරගැනීමේ අවස්ථාවත් වැටහුනා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

මේ සේරිවාණිජගේ කථාවෙන් කියැවෙන්නේ ගුණධර්ම නැතිව ආත්මලාභය මුල් කොට වැඩ කරන්න එපා කියලයි. ගුණධර්ම වලින් යුක්තව වැඩ කටයුතු කොට දියුණුව ලබන්න කියලයි. එය තමයි මේ ජාතක කථාවේ සැබෑ අරුත.



# ගුණ දකිමු

නමෝ බුද්ධාය!

## ‘හොඳ’ අහන්න කවුද අකැමැති?

හොඳට සිහිපත් කරලා බලන්න... අම්මා තාත්තා හරි, ගුරුවර වැඩිහිටියන් හරි, යහළුවන් හරි, අන් කවුරුන් ම හරි අපට හොඳ කියද්දී, අප ව පසසද්දී, අපේ ගුණ කියද්දී අපට මොන තරම් සතුටු හිතුණා ද? අපි මොන තරම් නම් ඒ ගැන ආයේ ආයෙමත් සිහි කරලා තියෙනවා ද?

දුවේ පුතේ, ලෝකයෙන් ගුණ අහන ආකාරයේ ගුණවත් ජීවිත අපට තිබීම ගොඩාක් හොඳ දෙයක්. සැබැවින් ම අප ගුණ සුවඳින් යුතු වෙනවා නම් මේ මිනිස් ලෝකය තුළ පමණක් නොවෙයි; දිව්‍යලෝක තුළත් ඒ ගුණ සුවඳ පැතිරී යනවා. සිල් රකින, ගුණවත් මිනිසුන් වෙත දෙදෙව්ලොවට අධිපති වූ සක් දෙවිඳු පවා වන්දනාමාන කරන බව සංයුත්ත නිකායේ සක්ක නමස්සන සූත්‍රයේ දැක්වෙනවා. නුවණැති සත්පුරුෂ මිනිසුන් විසින් ‘යහපත්’ කියා පසසන, ඒ වගේ ම දෙවියන් විසින් ද ‘සාදු’ කියා අනුමෝදන් වන ගුණධර්ම නම් වූ සොඳුරු මාලාදාමය වඩ වඩාත් මනරම් කරවන, වඩ වඩාත් සුවඳ කරලන උතුම් ගුණධර්මයක් ගැන අද අප ඔබට සිහිපත් කර දෙනවා. දුවේ පුතේ, ඒ ගුණය තමයි **‘ගුණ දැකීම’**...

ගුණ කියනවා අහන්න කැමති බොහෝ අය ලෝකයේ සිටියාට, අන් අයගේ ගුණ දකින අය නම් ලෝකයේ සිටින්නේ අඩුවෙන්. විශේෂයෙන් ම, පිරිහෙමින් යන ලෝකයක නැති ගුණ ඇතැයි කියා තමන් ව ඉස්මතු කර ගන්නවුන් මිස කැපී පෙනෙන ලෙසින් පවතින ම ගුණයක් පවා දැක අනුමෝදන් වන්නවුන්, සතුටු වන්නවුන් සොයා ගැනීම පහසු නැහැ. ඒ නිසා ම, ගුණයක් තුළ පවා නුගුණයක් සොයන ලෝකයකුයි අද අපට මුණගැසෙන්නේ. හැබැයි සත්පුරුෂයන්ගේ ලෝකය තුළ නම් තමන්ගේ ගුණය සඟවා තබා ගනිමින් අනුන්ගේ

ගුණායට ම යි ප්‍රශංසා කරන ලද්දේ...

අපගේ ශාස්තෘන් වහන්සේගේ ශාසනයේ මහානුභාව සම්පන්න වූ, පරම වූ, සුපූජනීය වූ මහා ශ්‍රාවක යුගළක් වැඩ සිටියා. ශාස්තෘන් වහන්සේ හා සමාන ව බුද්ධ ශාසනයේ කටයුතු කරන්නේ ය කියා ශාස්තෘන් වහන්සේ විසින් ම පසසන ලද ඒ අති උතුම් ශ්‍රාවකයන් වහන්සේලා ගැන ඔබ අසා තිබෙනවා. ඇහැළ මලේ පාටින් බැබළී ගත්, මහා ප්‍රඥා සම්පන්න සාරිපුත්ත මහරහතන් වහන්සේත්, නිල් මහනෙල් මලේ පාටින් බැබළී ගත්, මහ ඍද්ධි සම්පන්න මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේත් තමයි ඒ පරමෝත්තම වූ ශ්‍රාවකයන් වහන්සේලා.

භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටි එක කාලයක ඒ පරමෝත්තම වූ අග්‍ර ශ්‍රාවකයාණන් වහන්සේලා දෙනම කපෝතකන්දරකයේ වාසය කළා. එදා පුර පක්ෂයේ; ඒ කියන්නේ පසළොස්වක පොහොය දිනය එළඹෙමින් තිබුණ කාලයේ සඳ මෝරමින් තිබුණු දවසක්. සාරිපුත්ත මහරහතන් වහන්සේ තමන් වහන්සේගේ කෙස් රැවුල් බා එළිමහනේ භාවනාවක යෙදී වැඩසිටියා. උන්වහන්සේ ඒ භාවනා මනසිකාරය තුළ සමාපත්තියකට සමවැදී සිටියා.

ඒ මොහොතේ ම යහළු යකුන් දෙදෙනෙක් අහසින් ගමනක් යමින් සිටියා.

සඳ වැඩීගෙන එන රාත්‍රියේ, මැනැවින් කෙස් රැවුල් බා, සමවතට සමවැදී එළිමහනේ හුන් සාරිපුත්ත මහරහතන් වහන්සේගේ හිස ඒ සඳ එළිය වැටී දිලිසෙමින් තිබුණා. ඒ දුටු එක යකෙකුට දිලිසෙන මුඩු හිසට පහරක් දෙන්නට සිතුණා. ඒ යක්ෂයා තමන්ට සිතුණු දේ යහළු යක්ෂයාට කිව්වා. මහා ඉර්ධිමත් වූ, මහානුභාව සම්පන්න වූ, උදාර වූ මේ ශ්‍රමණයාණන් වහන්සේට පහර නොදෙන්න

යැයි යහළු යක්ෂයා තුන්පාරක් ම වළකද්දීත් අර යක්ෂයා එයට කන් දුන්නේ නැහැ. ඒ යක්ෂයා සාරිපුත්ත මහරහතන් වහන්සේගේ හිසට බලවත් පහරක් එල්ල කළා.

ඒ පහර, සුවිශාල හස්තිරාජයෙක් බිම දමන්නට වුණත් ප්‍රමාණවත් වූ, විශාල පර්වතයක් පලන්නට වුණත් ප්‍රමාණවත් වූ අතිශය බලවත් පහරක්. ඒ පහර එල්ල කළ මොහොතේ ම පහර දුන් යක්ෂයා එතැනින් මරණයට පත් වී මහා නිරයේ උපන්නා.

මිනිස් ඇස ඉක්මවා ගිය දිවැසින් මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේ මේ සිදුවීම දුටුවා. උන්වහන්සේ සාරිපුත්ත මහරහතන් වහන්සේ ළඟට වැඩම කොට මෙසේ විමසා සිටියා.

**"ප්‍රිය ආයුෂ්මතුනි, මොකද වුණේ? ඉවසන්න පුළුවනි ද? මොකද, දරන්න පුළුවනි ද? මොකද, කිසි දුකක් නැද්ද?"**

සාරිපුත්ත මහරහතන් වහන්සේ මේ ආකාරයෙන් පිළිතුරු දුන්නා.

**"ප්‍රිය ආයුෂ්මත් මොග්ගල්ලාන, මට ඉවසන්න පුළුවනි. ප්‍රිය ආයුෂ්මත් මොග්ගල්ලාන, මට දරා ගන්න පුළුවනි. නමුත් හිසේ යාන්තමට කැක්කුමක් තියෙනවා."**

ඒ මොහොතේ සැබැවින් ම සිදු වූයේ කුමක් ද කියා දිවැසින් දැක හුන් මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේ සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ගුණය ප්‍රකට කරමින් මේ ආකාරයෙන් වදාළා.

**"ප්‍රිය ආයුෂ්මත් සාරිපුත්තයන් වහන්සේ කොයිතරම් මහාර්ධිමත් ද? කොයිතරම් මහානුභාව සම්පන්න ද? යන මෙය ආශ්චර්යය යි...! අද්භූතයි...!**

**ප්‍රිය ආයුෂ්මත් සාරිපුත්ත, මෙතැන දැන් එක්තරා යකෙක් ඔබ වහන්සේගේ හිසට පහරක් දුන්නා. ඒක මහා බලවත් පහරක්. එවන් පහරකින් මහා හස්තිරාජයෙක් ව බිම දමන්නට වුණත් පුළුවනි. මහා පර්වතයක් ඒ පහරින් පලා දමන්නට වුණත් පුළුවනි. නමුත් ආයුෂ්මත් සාරිපුත්තයන් වහන්සේ මෙහෙමයි කියන්නේ. 'ප්‍රිය ආයුෂ්මත් මොග්ගල්ලාන, මට ඉවසන්න පුළුවනි. ප්‍රිය ආයුෂ්මත් මොග්ගල්ලාන, මට දරා ගන්න පුළුවනි. නමුත් හිසේ යාන්තමට කැක්කුමක් තියෙනවා.' කියලා…"**

තමන් වහන්සේගේ සබ්‍රහ්මචාරීන් වහන්සේ මේ ආකාරයෙන් තම ගුණය පවසද්දී සාරිපුත්ත මහරහතන් වහන්සේගේ හිත ඒ වර්ණනාවෙන් කම්පා වූයේ නැහැ. එනිසා උපන් කිසිදු සසැලීමක් නැති අකම්පිත, නිර්මල සිතින් ඒ උත්තම සාරිපුත්ත මහරහතන් වහන්සේ මේ ආකාරයෙන් මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේගේ ගුණය ම ඉස්මතු කරනු ලැබුවා…

**"ප්‍රිය ආයුෂ්මත් මොග්ගල්ලානයන් කොයිතරම් මහාර්ධිමත් ද? ප්‍රිය ආයුෂ්මත් මොග්ගල්ලානයන් කොයිතරම් මහානුභාව සම්පන්න ද යන මෙය ආශ්චර්යය යි…! අද්භූතයි…! මෙතැන හිටපු යකෙක්වත් දැක්කා. නමුත්… අපි නම් මෙතැන පාංශු පිශාචයෙක්වත් දැක්කෙ නෑ."**

මොනතරම් සුන්දර ගුණයක් ද මේ…! තම ගුණ වර්ණනාව පසෙකට ම කොට අනිත් පාර්ශවයේ ගුණය ඉස්මතු කරන්නට උන්වහන්සේලා අමුතුවෙන් සිත සිතා සිටින්නේ නැහැ…

අපගේ ශාස්තෲන් වහන්සේ 'සත්පුරුෂ' ස්වභාවය විස්තර කොට දක්වමින් එක් අවස්ථාවක මේ ආකාරයෙන් පෙන්වා දී තිබෙනවා. සත්පුරුෂයා අනුන්ගේ ඇති පුංචි ම ගුණය පවා අන් අය නොඅසද්දී ම වුණත් පවසනවා. අන් අය ඒ ගැන ඇසුවොත් වඩ වඩාත් ඉස්මතු කොට ම ඒ ගුණය ගැන කියනවා. ඒ වගේ ම යි සත්පුරුෂයා කෙනෙකුගේ නුගුණය අන් අය විමසද්දී පවා පවසන්නේ

බොහොම අඩුවෙන්, සුළු කොට දක්වමින්. හැබැයි කෙනෙකුගේ නුගුණය අන් අය නොඇසුවොත් කිසිසේත් ම පවසන්නේ නැහැ.

දැන් හොඳට හිතන්න, "අර කෙනාගේ මෙහෙම වැරදි අඩුපාඩු තියෙනවා" කියලා අප කියන වාරයක් වාරයක් පාසා දුවේ පුතේ අපට අහිමි වන්නේ සත්පුරුෂ බව යි. ඒ නිසාත් අප අන් අයගේ නුගුණ නොපවසන්නටත්, ගුණ ම දකින්නටත් කැමති වෙන්නට ඕන. ගුණ දකිනා බව නම් වූ ගුණය විසින් අප ව ඇතැම් පාපී අකුසල ධර්මයන්ට යට වීම වළක්වාලනවා. සිතින්, කයින්, වචනයෙන් අප අතින් වන - දුක් විපාක උපදවාලන වැරදි මේ උතුම් ගුණයෙන් නසන්නට පුළුවනි. ඒ දේ සිදු වෙන්නේ මෙහෙමයි...

ඔබේ ජීවිතයේ ඔබට තරහ ඇති වුණ, අමනාපකම් ඇති වුණ, නොහොඳ නෝක්කාඩු නොරිස්සුම් ස්වභාවයන් ඇති වුණ අවස්ථා ඇති. ඔබට ඒ වගේ ගැටීම් සහගත බවක් ඇති වුණේ ම කෙනෙකුගේ නුගුණයක් දැකීමෙන් නේ ද? සමහර විට ඒ කෙනා ඔබ අකැමැති දෙයක් කළා වන්නට ඇති. ඔබ අකැමැති දෙයක් කිව්වා වන්නට ඇති. හරි හෝ වේවා වැරදි හෝ වේවා ඔබ කැමැති නැති දෙයක් සිදු වද්දී තමයි ඒ ආකාරයට ඔබට තරහ ඇති වන්නේ. ඊට පස්සේ සිදු වුණ දේවල් මතක ද?

අපි පුංචි නිදසුනක් ගන්නම්... ඔබ අතින් වුණ වරදකට අම්මා හෝ තාත්තා හෝ බැණ වැදුන අවස්ථාවක් මතක් කර ගන්න. ඔබ හැඬුවේ නැති ද? නැති නම් තරහ පෙන්වන මුහුණකින් යුතුව දත්මිටි කමින් සිටියේ නැති ද? එකටෙක කිව්වේ නැති ද? කෑම නොකා නොබී සිටියේ නැති ද? තරහට නිදා ගත්තේ නැති ද? කථාබහ නොකර සිටියේ නැති ද? මොනයම් ම විදිහකින් හරි ඔබ ඒ බැණ වැදීමට ඇති අකැමැත්ත ප්‍රකාශ කළා නේ ද? දුවේ පුතේ, අපි බොහෝ දෙනෙකු එසේ කළ උදවිය. හැබැයි... ඒ දේ අපට කොහෙත් ම යහපත පිණිස නම් පවතින්නේ නෑ.

ඉපදෙන්නටත් පෙර දරුවන් මරා දමන, ඉපදුණ හැටියේත් දරුවන් මරා දමන අය ලෝකයේ සිටිනවා. අපේ අම්මා තාත්තා එහෙම කළේ නෑ. ඔවුන් එහෙම නොකළ නිසා අපට මේ උත්තම දහම් පද ඇහෙන යුගයේ මිනිස් ලෝකයේ වාසනාවන්ත උපතක් ලබන්නට හැකි වුණා. ඒ විතරක් ද අපට මේ තාක් කන්න බොන්න, අඳින්න පලඳින්න දුන්නේ ඒ දෙදෙනා ම යි. ආදරයෙන් හදපු ඒ අම්මා තාත්තා අපට වරද පෙන්වා දෙන්නේ අප ව හිංසාවකට ලක් කරන්න නෙමෙයි. අපට රිදවන්න නෙමෙයි. අපට පීඩා ඇති කරවන්න නෙමෙයි. දකින වරද පෙන්වා දී අප ව නිවැරදි කළේ නැති නම් ඒ වරද කිරීම නිසාවෙන් අනාගතයේ අප හිංසාවට ලක් වීම සිදු වනවා ම යි, අනාගතයේ අප රිදුම් දෙන සිත් ඇත්තවුන්, පීඩා විඳින්නවුන් බවට පත් වීම සිදු වෙනවා ම යි. පාපී අකුසල කර්මයන්ගේ විපාකත් පාපී ම යි. අන්න ඒ අනතුරෙන් අප ව ගලවා ගන්නයි අම්මා තාත්තා අපට මෘදු මොළොක්වත්, සැර පරුෂවත් අවවාද කරන්නේ. ඒ අවවාදයනට නොගැටී, අම්මා තාත්තා අපට අපමණ උපකාර කොට ඇති බවත්, ඔවුන් අපට බොහෝ සෙයින් ආදරය කරන බවත්, අපගේ අනාගත යහපත කැමැත්තෙන් ම අවවාද කරන බවත් සිහි කරමින් අප ඔවුන්ගේ වචනය දරා ගන්නවා නම්... ගැටීමක් පළ කරනු වෙනුවට වන්දනාමාන කොට මතු ඒ වරද නොවන්නට සංවර වීම පිණිස අවවාදය ගෞරවයෙන් භාර ගැනීමයි සිදු විය යුත්තේ...

බලන්න... ඒ ආකාරයෙන් ගුණය දකින්න පුරුදු වීම නිසා අම්මා තාත්තා කෙරෙහි පාපී සිතුවිලි ඉපදවීමෙන්, පාපී වචන කීමෙන් හා නුසුදුසු හැසිරීම් සහිත වීමෙන් රැස්වන - බොහෝ දුක් විපාක උපදවන අකුසල ධර්ම අපට බැහැර කරන්නට වාසනාව ලැබෙනවා. ගුණ දැකීම කියන්නෙන් අපට වාසනාව උපදවන ගුණයක්...!

ඔබට යමෙක් යමක් දෙන විට දන් දීම නම් වූ ගුණය දකින්න, ඒ දුන් දෙයෙහි අඩුපාඩු සොයන්න එපා... ඔබට යමෙක් යමක් පවසන විට එයින් යහපත සැලසෙනවා ද අයහපත සැලසෙනවා

ද යන්න බලන්න. යහපත සැලසෙනවා නම් සතුටු සිතින් එය පිළිග න්න. අයහපත නම් සැලසෙන්නේ දෙවරක් නොසිතා බැහැර කරන්න. 'අනේ මේ කෙනා අයහපත් දෙයකුයි කියන්නේ. මේ කෙනාට ඒ දෙයින් නිදහස් වෙන්න ලැබෙනවා නම් හොඳයි.' කියා සිතමින් ඒ කෙනාගේ ද යහපත ම කැමැති වෙන්න. 'අනේ මම නම් මේ වගේ අයහපත ඇති කරවන දේවල් කියන්නට හොඳ නැහැ. සිතන්නටවත් හොඳ නැහැ.' කියා තමන් සංවර වෙන්න.

ඔබට ප්‍රියමනාප සිනහවකින් සංග්‍රහ නොකළ, ඔබට හිතමිතුරු වචනයකින් සංග්‍රහ නොකළ කිසිවෙක් ඔබ සමීපයේ නැහැ. එය ඔවුන් සතු ගුණයක්. නොයෙක් අඩුපාඩු සහිත ඒ පිරිස් තුළින් යම් යම් අවස්ථාවල ඔබ ව අපහසුවට ලක් කරවන දේවල් සිදු වන්නට බැරිකමක් නැහැ. ඒ වෙලාවට ඔබට ආරක්ෂා වන්නටයි 'ගුණ දැකීම' නම් වූ ගුණය පුරුදු පුහුණු කර ගත යුත්තේ. අන් අය සිතින් කයින් වචනයෙන් අයහපත් කර්මයන් රැස් කළහොත් එහි විපාක ඒ අයට යි. ඔවුන් කරන කියන දේ අසා දැක අප සිතින් කයින් වචනයෙන් අයහපත් දේ කළහොත් ඒවායේ විපාක අපට යි. අඩුපාඩු සහිත මිනිසුන්ගේ අඩුපාඩු සමඟ ගැටෙන්නට යන්න එපා. අනතුරේ වැටෙන්නේ අප ම යි. ඒ නිසා ම, පුංචි හෝ ගුණයක් සිහි කොට සිතින් කයින් වචනයෙන් වැරදි සිදු වීම වළක්වා ගන්නට හොඳට පුරුදු පුහුණු වෙන්න.

මඟතොටේ යද්දි එද්දී ඔබ දකින මිනිසුනගේ ගුණවත්කම් අනුමෝදන් වීම එයට හොඳ ආරම්භයක්. පන්සලක් බෝධියක් දැක වන්දනා කරන මිනිසුන් ඔබ දකිනවා. සංඝයා වහන්සේලාට, පූජ්‍ය පක්ෂයට ආසනය ලබා දෙන, මඟ වියදම් ලබා දෙන අය ඔබ දකිනවා. වැඩිහිටියන්ට, ගැබිණි මව්වරුන්ට ආසනය ලබා දෙන අය ඔබ දකිනවා. පොදු මගී ප්‍රවාහන රථවල හිටගෙන යන පිරිසගේ ගමන් මලු ඉල්ලාගෙන් ඔවුනට පහසුව සලසන අසුන්ගෙන සිටින්නවුන් ඔබ දකිනවා. අන් අයට ගෞරවයෙන් කථා කරන, ප්‍රිය

වචනයෙන් කථා කරන අය ඔබ දකිනවා. දන් දෙන අය ඔබ දකිනවා. සිල් රකින අය ඔබ දකිනවා. කළ වරද වරද ලෙස පිළිගන්නා අය ඔබ දකිනවා. වැරදිවලින් අත්මිදෙන්නට උත්සාහ කරන අය ඔබ දකිනවා. මේ සියල්ල ම ගුණධර්ම නේ ද? සෑම යහපත් දෙයක් තුළ ම තිබෙන්නේ සොඳුරු ගුණයක්. ඒ ගුණය වෙන් කොට දකිමින් " සාදු!" කියා සතුටු සිතින් අනුමෝදන් වන්න දක්ෂ වීමත් බොහොම සුන්දර ගුණයක් ම යි.

දුවේ පුතේ, ගුණවත් වෙන්න කැමති වෙන්න. ඒ වෙනුවෙන් හැම කෙනාගේ ම ගුණය දකින්න පුරුදු වෙන්න. ගුණ සිහි කරන්න දක්ෂ වෙන්න. ඔබ ඒකාන්තයෙන් ම සත්පුරුෂ දරුවෙක් බවට පත් වනවා ම යි.

**'ගුණ දැකීම'** නම් වූ මේ සුන්දර ගුණයෙන් පිරිපුන් ව සත්පුරුෂ ලෝකයේ නෑයෙකු වන්නට ඔබට තෙරුවනේ ආශීර්වාදය සැලසේවා!!!

# නිර්මාණ ඉසව්ව

**පැදියෙන් සිතුවමින් නිසඳැසින්**
**සුසැදි ඔබේ නිර්මාණ එකතුව**




සඳුනිකා නවෝදි දියණිය විසින් එවූ නිර්මාණයක්...



උත්පලා ගිම්හානි දියණිය විසින් එවූ නිර්මාණයක්...




කාවින්ද්‍යා චමෝදි ජයතිස්ස දියණිය විසින් එවූ නිර්මාණයක්...




චේතනා සෙව්වන්දි දියණිය විසින් චවූ නිර්මාණයක්...



සංජන ප්‍රියනාත් පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...





දිනුෂි අප්සරා දියණිය විසින් චවූ නිර්මාණයක්...




තාරුක දිල්ෂාන් තේනබදු පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...



කල්ප කවිඳු රත්නවීර පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...



ප්‍රමුද දිලුක්ෂ පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...




තක්ෂිලා සඳුනි දියණිය විසින් චවූ නිර්මාණයක්...

## පුතුනි නුඹට....

කොඳ කැකුළු හිරු කිරණ සිඹිද්දි අරුණෝ
විකසිතව සුවඳ විහිදුවන ලෙස දසතේ
මෙතෙක් කල් වූ වෙහෙස නොයවාම අපතේ
නුඹ දිනූ කටඉමට සිත තුටින් පිරුණෝ
මවක් මෙන් පුතු රකින හොවා තම ඇකයේ
හදවතින් අප මෙතෙක් සවිය දිරි දුන්නේ
හැකි ලෙසින් අප හටත් පිනට ලද දිවියේ
මිල මුදල් යස ඉසුරු නැතත් පිරි බෝ සේ
අඩුපාඩු බොහෝමයි නුඹේ දිවි මං පෙතේ
මඩෙන් සුපිපුණු පියුම් පිපී දිලෙන සේ
නුඹ ගිය දුරත් බොහොමයි කටු කොහොල් අතරේ
හුඟක් දේ තිබුණත් පිනට ලද දිවියේ
ඉන් එලක් නොලබනා දුදන ජන අතරේ
තරු අතර පුන් සඳක් වී ය නුඹ අඹරේ
බබළන්න තව තවත් වෙර අරන් පුතුනේ
මෙත් සිතින් අපි රැඳුනු දම් සිසිල අතරේ
මහා සෙවණැල්ල වූ මහමෙව්නාවේ
සෙවණ ලබන්නට ලොකු ස්වාමීන් වහන්සේගේ
නුඹත් අපත් පෙර පින් කළා එක සේ
සසර කෙටි කර ගන්න ඒ පිනැති ඇසුරේ
අමතක නොකරන්න නිබඳ පුතණුවනේ
අදත් හෙටත් හැමදාම නොවෙනස්ව එක සේ
අත් නො හැර රැඳෙනු අත්වැලට නුඹ ලද ඒ
හමුවුණා නැසැකවම පෙරත් අපි සසරේ
අපි නුඹට, නුඹ අපිට පිහිට වෙන්නැති නිබඳේ
ගෙවනතුරු මේ සසර යළි යළිත් පුතුණෝ
අප අපට හමුවේවි නෙක වරක් එක සේ
යළිත් හමුවෙනා තුරු යළි වරක් අදරින්
මතකයේ හිඳිමු අපි අපේ සිත් ඇතුළින්

සුභ පතමු නුඹට තව යන්න දුර සෙනෙහෙන්
ගමට හෙට මුළු රටට ඉසුරුව දිලෙමින්...

කැපකරු මා පියන්...

## කැපකරු මාපිනි....,

නව සඳේ සොමි කිරණ
ලොව දකින වෙලාවේ
සංසාර බැමි මතින්
අප හමු වුණා මේ ලොවේ
මුලාවක් නො වන්නට මඟ හසර
උදා කර
දුර යන්න වෙර දුන්නෙ
නුඹයි කැපකරු මා පියනි.

ලොකු ස්වාමීන් වහන්සේගේ
කරුණාව දයාවේ පින් මහිම
මැදින් මහමෙව්නාවේ
ඇවිද ගොස් මේ සසරේ
අතිර බව වටහා ගන්න
හැකිවුණා පුංචි මට
ලැබුණු මේ දිවි පෙතේ
නිසි මගේ ඇවිද ගොස්

දිවියට ලැබෙන කඩඉම්
ජය ගන්නට වෙර දරමින්
දහසක් බාධක මැදින්
දුක දැනෙන විට සොමින්
දෑස් හැර බලමි මම
ලොව්තුරා බුදුන්ගේ රූපය

මොහොතකට නිවී යයි
මගේ මේ දුක් දොම්නස්

ඉදින් ඇරඹුන මේ දිවියේ
සරු කරන්නම් වෙර දරා
දම් සෙවණ වෙත නිතර
ඇවිද යන්නට මා හට නොහැක
පෙර සසරේ බැඳි මැදින්
අසරණයි තවම මම

මාගේ දිවියට ලබාදුන්
පිහිට අපමණයි
මා ඉන් හැකි ලෙසට
නෙලා ගත්තෙමි ඵලය
ඉදිරිය ද දිනමි මම
ඔබ සැමට පින් දෙමින්

මහමෙව්නාවේ බෝ සමිඳු
අභියසදි දිනක හමුවේවි
අප සංසාර පුරුද්දට
එතෙක් සැනසුම පතමි
සොම්නසින් ඉසුරු බර
පුතෙක් ලෙස ඔබ සැමට

ඉසුරු පුතණුවන් විසින් එවූ
නිර්මාණයක්...

## දෙවැනි මවුනි....

දෙවැනි මවුන් ලෙස
මාගේ දිවියට සපැමිණි ඔබ
නිරතුරු සොයා බැලුවා
මා ගැන....
මා කවුරුන්දැයි
නො දන්නා මුත් ඔබ
ඔබ ඉපැයූ මුදලින්
මා හටද කොටසක් වෙන්කොට
මහා හට එව්වා
හද පිරි තුටින්....
පෙර භවයේ දී මෙලෙසින්
මාගේ දිවියට
ඔබ දිරි දෙන්නැති
අද මෙන් දුරින් හිඳ....
මා ඔබ දැක නැත
ඔබ මා දැක නැත
එනමුත්,
හදින් ළං වී ඇත
ඔබට මා....
මේ කරනා උපකාරයට
සදා ණයගැති වන්නෙමි මා
ඔබට,
මාගේ කැපකරු මා පියණී...,
යම් දිනෙක දැකගන්නට
හැකි වුවහොත් මට ඔබ
එදිනට,
ඔබේ පාද නමස්කාර කොට
ආශිර්වාද ලැබ ගන්නෙමි
ඔබේ ද සවියෙන්
ලොවම දිනන්නට
යම් මතු දිනෙක....
ඔබ අද මේ කරනා
උතුම් සත්කාරය
තවත් මා වන් දරුවෙකුට
කරන්නට හැකි වේවා'යි
පතමි මා....!

තනුජා දිල්රුක්ෂි දියණිය විසින් එවූ නිර්මාණයක්...

## අහිමි පිය සෙනෙහස...

සිටින විට සවසට
විඩාපත් වී දවසම
පුරුදු ලෙස ඇමතුව මුත්
නැත එහි ඔබේ කටහඬ

නුහුරු හැඟුමක් එක්ක
සිහි වෙනවා
ඔබ නික්ම ගිය මඟ
කුමක් කරම් ද
දැන් මම
අහිමි විය ඔබෙ සෙනෙහස....

තිළිණි මධුශානි දියණිය විසින් එවූ නිර්මාණයක්...

## දයාබර ඔබ නමට....

දස මසක් කුස හොවා
මා ලොවට බිහිකළ
උත්තරීතර මව් පදවිය
ලැබූ ඔබෙ නමට මම
ණය ගැතියි මෑණියනි....

සිව් හසක් සිසු කැලට
ලබන්නට නැත නුවණ
මග පෙන් වූ නුඹ
මගේ දිවි මං එළිය
ලැබ දුන්නු ඔබෙ නමට
ණය ගැතියි විදුමවිනි....

නෙත් නුවන් පාදවා
දිවි ගමන එළිය කළ
මගේ කැපකරු මව් පියාණෙනි
පුදමි මම මල් මිටක්
මහද පිරි සෙනෙහසින්
මා විසින් ඔබ නමට

මා ගෙවන දිවි ගමන
කෙට කරන්නට මේ මට
කියාදෙන හාමුදරුවෙනි
වදිමි මම සැදැහැතින්
ඔබේ පා යුගල ලග
දණ නමා බැති සිතින්

තිළිණි මධුශානි දියණිය විසින් එවූ නිර්මාණයක්...

## අම්මා....

උදයම මම නැගිටින විට
නිදියහනේ නැත සැම දින
අප සැමගෙ බඩ පිරුමට
උදයට පෙර අරඹයි වැඩ
කේන්තියෙන් බැන්නත් මම
සෙනෙහසකින් බලයි එවිට
ආදරයේ උල්පත ඈය
මගෙ මාණික්‍යය ද ඈයය
මුලු දවසම වැඩ කරලා
නිදියහනේ නිදියන විට
මතු දිනයද සිතන ඈයට
කවදා හෝ දෙමි මම සැප
මව් සෙනෙහස කෙතරම් දෝ
සිතුමට නම් බෑ දැන් මට
ඈගෙ සම්පත දරුවා බව
විගස විගස සිතෙයි එවිට
සුළඟක් වී ඔබ යන විට
සුසුමක් වී මම එන්නම්
සයුරක් සේ වැජඹෙන විට
ජල බිඳුවක් සේ ඉන්නම්
සුවඳ හමන මල් ගොමුවක
ඔඹරෙක් වී මම ඉන්නම්
මතු සසරේ උපදින විට
ඔබෙ පුතු වී ඉපදෙන්නම්....

මිනෝද් පුලස්ති පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...

කඳු මැදි කරන් හිරු නැග එන උදය රැයේ
නො පිබිදි කුසුම් පිපුමට වෙර දරණ පැයේ
හද රැදි සෙනෙහසින් හැම දරුවෙකුට දැයේ
මෙත බැඳි මව්පියන් ගුණ ගී තරඟ වැයේ

දහදිය හෙලා උපයන දේ ලොබ නොකර
කර වැය දරුවන්ට උගනින සිප් සතර
නිවනය කියන සැපතම පතනා පවර
නොම කිය හැකිය ඔබ ගුණ කරමින් අකුර

පින්බර බව දනිමි නොදුටුව මුත් වුවන
සුන්දර යැයි සිතමි සිත පැණි පොද ලෙසින
ගින්දර කෙළෙස් අතු ගා මෙත් දම් පුරන
පෙම්බර මව්නි පතනෙමි වෙසෙනට සුවෙන

බැදු අම්මාට බිව් කිරි ණය ගෙවන්නට
හැදු අප්පච්චිගේ දහදිය නිවන්නට
සැදු උපකාර කැපකරු පිය තුමන් හට
පිදු මට අවසරයි පා යුග වඳින්නට

කැපකරු මව්පියනි ඔබ හට සෙත වේවා!
පිනසරු 'ශ්‍රද්ධා'ව දිගුකල් වැජඹේවා!
ගුණගරු කරන දරුවන් තව බිහි වේවා!
සිරිසරු ලක්දෙරණ සුරපුරයක් වේවා!

අංජලී උපෙක්ෂා මුධුවන්ති දියණිය විසින්
එවූ නිර්මාණයක්...

## හොඳ සිත් සැමදා වාසනාවන්....

අසරණකම දුටුවම සිරිලක දරුවන්ගේ
සහනයක් සැලසීමට ඔබලා එකතු වුණෝ
එයින් දිරිය ගෙන සයුරෙන් එතෙර වුණෝ
ඔබලා හට දින දින පින් අත්වන්නේ

ජීවය ගෙනෙන ළා හිරු වාසනාවන්
සිසිලස ගෙනෙන ඇළදොළ වාසනාවන්
සුවඳට පිපෙන වන මල් වාසනාවන්
භවයෙන් භවය හොඳ සිත් වාසනාවන්

සොනාලි කාවින්දයා දියණිය විසින් එවූ නිර්මාණයක්...

## පුංචි මල් කැකුළියේ....

මහා සැඩ පහරක දී
චණ්ඩ මාරුතයක දී
වන්න ඔබ
කිසිදා නො සෙල්වෙන
ඉන්ද්‍රකීලයක්....

විෂඝෝර සර්පයින් හා
ගිජුලිහිණියන්
දසත් විදහාගත්
වන වෘකයින් මැද
වන්න ඔබ
සිංහ ධේනුවක්....

කුරිරු ලොව ජය ගන්න
දුටු දනන් පිනවන්න
මෝදු වූ සඳක් සේ
වන්න ඔබ
පින්බර විශාකාවක්....

පරිස්සම් වෙයන්
පැංචියේ
ගෙන ආ ඔලොගුවේ
ඇත බොහෝ දෑ පිරී
"බියකරුය මේ සසර"

කැපකරු මව සහ පවුලේ සැම

**ඔබ කැමති මාතෘකාවකින් ඕනෑම නිර්මාණයක් ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව අංශය වෙත යොමු කරන්න.**

ශ්‍රද්ධා සමාජ සත්කාර අංශය, නො. 369,
හේවාගම, කඩුවෙල.
www.shraddha.lk | edu@shraddha.lk

# මෙත් සිත වඩමු

# මෙත් සිත වඩමු

මෙත් සිත වඩන්නට කැමති කෙනාට මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස ගැන අවබෝධයක් තිබිය යුතු වෙනවා. ඒ මෙත් සිත වඩන කෙනාට ආනිසංස එකොළසක් ලැබිය හැකි බව බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දෙනවා. මේ විස්තරය අඩංගු වෙන්නේ මෙත්තානිසංස සූත්‍රයේ යි.

මෛත්‍රී භාවනාව බහුල වශයෙන් වඩන, යානාවක් වගේ පුරුදු කරන, වස්ත්‍රයක් වගේ පුරුදු කරන සිතේ හොඳින් පිහිටුවාගෙන පුරුදු කරන කෙනාට ලැබෙන ආනිසංස එකොළහ නම්,



සැප සේ නිදා ගන්නවා
**(සුඛං සුපති)**



සැප සේ අවදි වෙනවා
**(සුඛං පටිබුජ්ඣති)**



නිදා සිටින විට නපුරු සිහින දකින්නේ නෑ
**(න පාපකං සුපිනං පස්සති)**



මිනිසුන්ට ප්‍රිය වෙනවා
**(මනුස්සානං පියෝ හෝති)**



අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙනවා
**(අමනුස්සානං පියෝ හෝති)**



දෙවිවරු ඔහුව ආරක්ෂා කරනවා
**(දේවතා රක්ඛන්ති)**



ගින්නෙන්, වසවිස අවි ආයුධවලින් විපත් සිදු වෙන්නේ නෑ.
**(නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා ඛමති)**



සමාධිය ඉක්මනින් ම ඇති කර ගන්න පුළුවන්
**(තුවටං චිත්තං සමාධියති)**



ශරීර වර්ණය පැහැපත් වෙනවා
**( මුඛවණ්ණෝ විප්පසීදති)**



සිහි මුළා නොවී මරණයට පත් වෙනවා
**(අසම්මූළ්හෝ කාලං කරෝති)**



මේ ජීවිතයේ දී ඉහළ මාර්ගඵල
අවබෝධයකට පත් වූයේ නැති නම්
බ්‍රහ්ම ලෝකයේ උපදිනවා
**(උත්තරිං අප්පටිවිජ්ඣන්තෝ**
**බ්‍රහ්මලෝකූපගෝ හෝති)**


# මෛත්‍රිය වඩමු




මෛත්‍රිය භාවනාවක් වශයෙන් වඩන්න සූදානම් වන ඔබ මුලින්ම නිදහස් තැනක් සොයා ගත යුතු වෙනවා. චෛත්‍ය මළුවක්, බෝධි මළුවක්, විහාර මන්දිරයක්, තමන්ගේ නිවසේ කාමරයේ, එළිමහන් නිදහස් පරිසරයක් මේ කියන ඕනම තැනක් ඔබට ඒ සඳහා තෝරගන්න පුළුවන්. වාඩි වී, සිටගෙන, ඇවිදිමින්, නිදගෙන කියන ඕනෑම ඉරියව්වකින් මෙම භාවනාව වඩන්න පුළුවන්. නිශ්චිත ස්ථානයක් හෝ ඉරියව්වක් අවශ්‍ය නෑ. ශබ්ද අඩු තැනක් නම් වඩාත් හොඳයි. බාහිර ශබ්දවලට අවධානය යොමු නොකර සිත වර්තමානයට ගන්න. අතීතයට හෝ අනාගතයට යන්නට නොදී තමා තුළට ම අවධානය යොමු කරගන්න.



ඔබ කොන්දේ අමාරුව නැති කෙනෙක් නම් පළඟක් බැඳගෙන (එරමිණිය ගොතාගෙන) කය ඍජු කරගෙන ඒ සඳහා සූදානම් වීම වඩාත් සුදුසුයි. එහිදී පුළුවන් තරම් තමන්ගේ කොන්ද ඍජුව තබාග න්න උත්සාහ කරන්න.




ඔබ කොන්දේ අමාරුව හෝ වෙනත් රෝගයකින් පෙළෙන කෙනෙක් නම්, ඒ කියන්නේ පළඟක් බැඳගෙන වාඩිවීමේ හැකියාව ඔබට නැතිනම් පුටුවක් හෝ වෙනත් සුදුසු උස් ආසනයක් වුව ද මේ සඳහා තෝරා ගැනීමේ දොසක් නැත.

ඉන්පසු ඔබ මුලින්ම දෑස් පියාගෙන තමන් දෙසට මුළු සිතම යොමු කරන්න.

මෛත්‍රිය වඩන්න පෙර මුලින්ම අප සරණ ගිය ශාස්තෘන් වහන්සේගේ ගුණ කෙටියෙන් සිහි කරන්න. බුදුරජාණන් වහන්සේ තමයි අපට මේ සියල්ල කියා දුන්නේ. ඒ නිසා බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහි කිරීම අපේ සිත එක් කරගැනීමට බෙහෙවින් ඉවහල් වෙනවා.

ඉන්පසු ඔබ මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස ගැන සිතින් මෙනෙහි කරන්න. මෙය සිහි කිරීම මෙත් සිත වඩන්න සිතේ කැමැත්තක් ඇති වෙන්න හේතු වෙනවා.

ඉන්පසු ඔබ මේ අයුරින් මෛත්‍රී භාවනාව මුලින්ම තමන්ට වඩමින් පසුව අන් අයට ද ක්‍රමයෙන් වඩන්න පටන් ගන්න.

මම වෛර නැත්තෙක් වෙම්වා!
තරහ නැත්තෙක් වෙම්වා!
ඉරිසියා නැත්තෙක් වෙම්වා!
දුක් පීඩා නැත්තෙක් වෙම්වා!
සුව සේ ජීවත් වෙම්වා!
ශාන්ත සුවයට පත් වෙම්වා!

මා මෙන් ම මේ නිවසේ සිටින සියලු සත්වයෝ
වෛර නැත්තෝ වෙත්වා!
තරහා නැත්තෝ වෙත්වා!
ඉරිසියා නැත්තෝ වෙත්වා!
දුක් පීඩා නැත්තෝ වෙත්වා!
සුව සේ ජීවත් වෙත්වා!
ශාන්ත සුවයට පත් වෙත්වා!

මා මෙන් ම මේ ගමේ සිටින සියලු සත්වයෝ....
මා මෙන් ම මේ නගරයේ සිටින සියලු සත්වයෝ....
මා මෙන් ම මේ පළාතේ සිටින සියලු සත්වයෝ....
මා මෙන් ම මේ රටේ සිටින සියලු සත්වයෝ....
මා මෙන් ම මේ ලෝකයේ සිටින සියලු සත්වයෝ....
මා මෙන් ම මේ සියලු සත්වයෝ ම වෛර නැත්තෝ වෙත්වා!
තරහා නැත්තෝ වෙත්වා!
ඉරිසියා නැත්තෝ වෙත්වා!
දුක් පීඩා නැත්තෝ වෙත්වා!
සුව සේ ජීවත් වෙත්වා!
ශාන්ත සුවයට පත් වෙත්වා!

මේ අයුරින් ඔබට හැකිතාක් නැවත නැවත භාවනාව පුරුදු කරන්න උත්සාහ කරන්න.

## ඛදිරවනයේ රේවත තෙරුන්ගේ ගාථා

මං ගිහි ජීවිතය අත්හැරලා මහණ වෙච්ච දවසේ ඉඳලා මේ දක්වාම මගේ හිතේ කිසිම ද්වේෂ සහගත සිතිවිල්ලක් ඇති වෙච්ච බවක් මං දන්නෙ නෑ.

මේ සත්වයෝ මැරෙත්වා! වැනසෙත්වා! දුකට පත්වෙත්වා! යන හැඟීමක්වත් මෙච්චර දීර්ඝ කාලයක් තුළ මා තුළ ඇතිවුණ බවක් මං දන්නෙ නෑ.

මෛත්‍රිය ගැන බුදු සමිඳුන් කියා දුන්න ආකාරයට ම මං මෛත්‍රී භාවනාව කළා. අප්‍රමාණ මෙත් සිත ක්‍රම ක්‍රමයෙන් පුරුදු කළ බව මං දන්නවා.

තරහක් නැති සිතින් යුතුව හැම මිතුරන් යහළුවන් සත්වයන් හැමදෙනා ගැනම අනුකම්පාවෙන් මං මෛත්‍රී සිත වඩනවා.

කිසිම බැඳීමක් නැති, වෙනස් වීමක් නැති ඒ මෛත්‍රියෙන්මයි සිතේ සතුට ඇති වෙන්නේ. නුවණ නැති ජනතාව මෙය පුරුදු කරන්නෙ නෑ. එහෙත් මං සතර බ්‍රහ්ම විහරණය ම පුරුදු කරනවා.

(ථේර ථේරී ගාථා - ඛුද්දක නිකාය)

මහා තෙද ඇති, මහා බල ඇති, මහා අනුකම්පා ඇති, ආර්ය වූ
අංගුලිමාල මහරහතන් වහන්සේගේ අනන්ත ගුණානුභාව බලයෙන්
සැමට සෙත් වේවා!

## අංගුලිමාල පිරිත

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨානධෝවනං
උදක'ම්පි විනාසේති - සබ්බමේව පරිස්සයං
සොත්ථිනා ගබ්භවුට්ඨානං - යං ච සාධේති තං ඛණේ
ථේරස්සංගුලිමාලස්ස - ලෝකනාථේන භාසිතං
කප්පට්ඨායිමහාතේජං - පරිත්තං තං භණාමහේ

ඒ අංගුලිමාල මහරහතන් වහන්සේ වැඩ හිඳ යම් පිරිතක් දෙසා වදාළ තැනක් ඇද්ද, එම තැන සේදූ දිය පවා සියලු පීඩා දුරු කර දමන්නේ ය. ගර්භණී මාතාවක් යම් දුකකින් පෙළෙයි නම්, ඒ දුක සැණෙකින් බැහැර වී සුවපත්ව නැගිටින්නී ය. ලෝකනාථ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් කල්පයක් බල පවතින මහා තේජසින් යුතුව ආඥා කොට, අංගුලිමාල මහරහතන් වහන්සේ විසින් වදාරණ ලද ඒ අංගුලිමාල පිරිත අපි දැන් කියන්නෙමු.

යතෝ'හං භගිනි, අරියාය ජාතියා ජාතෝ නා'භිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වෝරෝපේතා, තේන සච්චේන සොත්ථි තේ හෝතු, සොත්ථි ගබ්භස්සා'ති.

"පින්වත් නැගණියෙනි, යම් දිනෙක මම උතුම් නිවනට පමුණුවන මාර්ගඵලලාභී ආර්ය ජාතියෙහි උපත ලැබුවෙම් ද, එදා සිට දැන දැන ප්‍රාණියෙකු ජීවිතයෙන් තොර කළ බවක් නොදනිමි. මේ සත්‍යානුභාවයෙන් ඔබට සෙත් වේවා! ඔබගේ දරුගැබට සෙත් වේවා!"

තෙරුවන් සරණයි!

©2018 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P. 0112 571 471 | Fax : 0112 548 400 | Web : www.shraddha.lk | Email : edu@shraddha.lk
www.facebook.com/ShraddhaTV www.youtube.com/ShraddhaTV www.google.com/+ShraddhaTV www.twitter.com/ShraddhaTV